(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 2(12).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2023 ඔක්තෝබර් 27 සිකුරාදා**

## 2023 නොවැම්බර් 14 අඟහරුවාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2848/2023

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ලංකා ධීවර සංස්ථාව සතු ශීතාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම ශීතාගාර ස්ථාපිත කර ඇති ප්‍රදේශ කවරේද;

(iii) එම එක් එක් ශීතාගාරයේ ගබඩා ධාරිතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ශීතාගාර බදු පදනම මත පෞද්ගලික අංශයට ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම ආයතන තෝරාගන්නා ලද ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2971/2023

ගරු හේෂා විතානගේ මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දඹදිව වන්දනා චාරිකා සංවිධානය කරනු ලබන ලියාපදිංචි ආයතන හා ඒවායේ ලිපිනයන් ශ්‍රී ලංකාවේ එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වර්ෂ 2015 සිට 2018 දක්වා දඹදිව වන්දනා කරන ලද ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) දඹදිව වන්දනා චාරිකා සංවිධානය කරනු ලබන සමහර ආයතන එම වන්දනාකරුවන්ගේ සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග අනුගමනය නොකරන බව දන්නේද;

(iv) ඒ හේතුවෙන් එම වන්දනාකරුවන් දැඩි දුෂ්කරතාවයට පත්වන බව පිළිගන්නේද;

(v) වන්දනාකරුවන්ගේ සුරක්ෂිතභාවය තහවුරු කිරීමට සහ දඹදිව වන්දනා චාරිකා සංවිධානය කරනු ලබන ආයතන නියාමනය කිරීමට විධිමත් ක්‍රියාමාර්ග සකස් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3074/2023

ගරු අශෝක් අබේසිංහ මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ —

(i) සේවය කරනු ලබන මුළු සේවකයන් සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ස්ථිර සහ කොන්ත්‍රාත්/අනියම් පදනම මත සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) කොන්ත්‍රාත්/අනියම් පදනම මත මේ වනවිට සේවය කරනු ලබන සේවකයන් ස්ථිර කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3098/2023

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ගොනු කර තිබූ මූලික අයිතිවාසිකම් පෙත්සම්වල තීන්දුව ප්‍රකාශයට පත් කරන ලද දිනය කවරේද;

(ii) එම නඩු තීන්දුව මඟින් වරදකරුවන් කර ඇති එක් එක් පුද්ගලයාගේ නම, ලිපිනය, මේ වනවිට දරනු ලබන තනතුර සහ ඉහත නඩු තීන්දුව ලබා දෙන අවස්ථාව වන විට දරන ලද තනතුර හා සේවා ස්ථානය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පුද්ගලයන් මේ වනවිටත් උක්ත ආයතනවල ඉතා ඉහළ තනතුරු දරමින් සිටීම, ඉහත අධිකරණ තීන්දුව ක්‍රියාත්මක කිරීමට බාධාවක් බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3578/2023

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට විදේශ රටවල සේවය කරනු ලබන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) වැඩිම ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සිටින රට සහ අඩුම ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සිටින රට අනුව එම ශ්‍රමිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ශ්‍රමිකයන් සේවය කරනු ලබන රටවල් අතරින් ශ්‍රී ලංකාව විසින් තානාපති සබඳතා පවත්වන සහ තානාපති සබඳතා නොපවත්වන රටවල් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ සුභසාධනය උදෙසා ඔවුන් සේවය කරනු ලබන රටවල් සමඟ තානාපති සබඳතා පැවැත්වීම වැදගත් වන බව පිළිගන්නේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2023 නොවැම්බර් 15 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3109/2023

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) යාපනය, නෙඩුන්තිවු දූපතේ මේ වනවිට සිටින අශ්වයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දූපතට පළමු වරට අශ්වයන් ගෙන එනු ලැබූ වර්ෂය කවරේද;

(iii) එම දූපතේ සිටින අශ්වයන්ට ලබා දෙනු ලබන ආහාර කවරේද;

(iv) එම අශ්වයන් රැකබලා ගැනීම සඳහා පත්කර ඇති නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(v) එම අශ්වයන් රැකබලා ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලයක් නෙඩුන්තිවු දූපතෙහි ස්ථාපිත කර තිබේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3174/2023

ගරු දයාසිරි ජයසේකර මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2017 සිට 2021 දක්වා වී මිලදී ගැනීම සඳහා රජය විසින් වෙන් කරන ලද මුළු මුදල;

(ii) එක් එක් දිස්ත්‍රික්කයන් සඳහා වෙන් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන්;

(iii) එක් එක් දිස්ත්‍රික්ක වෙත වෙන් කරන ලද මුදල, මුළු මුදලේ ප්‍රතිශතයක් ලෙස;

(iv) ඉහත කාලය තුළ මිලදී ගන්නා ලද වී ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වී මිලදී ගැනීම සඳහා 2022 වර්ෂයේ රජය විසින් වෙන් කරන ලද මුදල;

(ii) 2022 වර්ෂයේ මේ වනවිට මිලදී ගෙන ඇති වී ප්‍රමාණය;

(iii) ඒ සඳහා වැය කරන ලද මුදල;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3232/2023

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මීගමුව-කුලියාපිටිය මාර්ගයේ, තුම්මෝදර නව පාලම ඉදිකිරීම සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදනය කොපමණද;

(ii) එම පාලමේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) එම ඉදිකිරීම් කටයුතු අවසන් කළ යුතු දිනය කවරේද;

(iv) එම පාලම ඉදිකරනු ලබන කොන්ත්‍රාත් සමාගම කවරේද;

(v) මේ වනවිට එම කොන්ත්‍රාත් සමාගමට ගෙවා ඇති මුදල කොපමණද;

(vi) තුම්මෝදර නව පාලමේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3409/2023

ගරු වාසුදේව නානායක්කාර මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 668 අළුත්ගම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කිලෝමීටර් 1.5ක් පමණ වන ‘‘ගම්මාන පාර’’, ග්‍රාමීය මාර්ග ලක්ෂයක් කාපට් කිරීමේ වැඩසටහන යටතේ කාපට් අතුරා සංවර්ධනය කිරීම සඳහා වැඩ ආරම්භ කරන ලද නමුත් මීට මාස 6කට පමණ පෙර සංවර්ධන කටයුතු අතරමග නවතා ඇති බවත්;

(ii) මාර්ගයේ තිබූ තාර හා කොන්ක්‍රීට් කොටස් ගලවා තැනින් තැන ABC තට්ටුවක් පමණක් දමන ලද අතර වර්ෂාව හේතුවෙන් එම ABC තට්ටුවද සෝදා ගොස් මේ වනවිට එම මාර්ගයේ ගමන් කිරීමට පවා නොහැකි අන්දමට අබලන් වී ඇති බවත්;

(iii) කාපට් අතුරන තෙක් තාවකාලික පිළියමක් ලෙස එම මාර්ගය සඳහා තාර තට්ටුවක් දැමීමට කළුතර, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඇස්තමේන්තුවක් යොමු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඒ අනුව, තාවකාලික තාර ස්ප්‍රේයක් යොදා ඉහත මාර්ගය කඩිනමින් පිළිසකර කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3505/2023

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023 වර්ෂය සඳහා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය වෙනුවෙන් අයවැයෙන් වෙන් කළ මුළු ප්‍රතිපාදනය කොපමණද;

(ii) ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් සඳහා වෙන් කළ ප්‍රතිපාදනය ඉහත මුළු ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත ප්‍රතිපාදනයෙන් ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් සඳහා මේ වනවිට නිකුත් කර ඇති මුදල, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2019 සිට 2023 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ රාජ්‍ය විශ්වවිද්‍යාලවල පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා වෙන් කළ සහ නිකුත් කළ ප්‍රතිපාදනය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) 2021 සිට 2023 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය, කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සඳහා වෙන් කළ සහ නිකුත් කළ ප්‍රතිපාදන වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 නොවැම්බර් 16 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3350/2023

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රිජ්වේ ආර්යා ළමා රෝහලේ මේ වනවිට සේවය කරනු ලබන ප්‍රධාන සුළු සේවා පාලකවරයා වර්ෂ 16කට අධික කාලයක් එම රෝහලේ සේවය කරමින් සිටින බවත්;

(ii) ඔහු විසින් සිදු කරනු ලබන විවිධ අක්‍රමිකතා සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පැමිණිලි විශාල සංඛ්‍යාවක් ලැබී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පැමිණිලි සම්බන්ධ පරීක්ෂණ අතරමග නතර කිරීමට හේතු කවරේද;

(ii) ඉහත සේවකයා සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීමට හේතු කවරේද;

(iii) ඔහු විසින් සිදු කරනු ලබන විෂමාචාර සහ අක්‍රමිකතා නැවැත්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3351/2023

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පළාත් සභා පාලනය යටතේ පවතින රජයේ රෝහල් හා සෞඛ්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් රෝහලේ හා සෞඛ්‍ය මධ්‍යස්ථානයේ නම සහ පිහිටුවා ඇති පළාත හා දිස්ත්‍රික්කය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් රෝහල් සිටිය යුතු හා මේ වනවිට සිටින වෛද්‍යවරුන් සහ විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත සඳහන් රෝහල්වල පවතින වෛද්‍යවරුන්ගේ පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වැඩිදුර අධ්‍යාපනය සඳහා 2015 වර්ෂයෙන් පසු විදේශ ගත වූ වෛද්‍යවරුන් නැවත ශ්‍රී ලංකාවට නොපැමිණ තිබේද;

(ii) එසේ නම්, එම වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3358/2023

ගරු ජයන්ත සමරවීර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කර ඇති අත්‍යාවශ්‍ය බටහිර ඖෂධ සංඛ්‍යාව කොපමණද;

(ii) එවායේ ඖෂධ නාමයන් කවරේද;

(iii) එම එක් එක් ඖෂධය නිෂ්පාදනය කරනු ලබන රට, නිෂ්පාදනය කරනු ලබන සමාගම/ආයතනය සහ ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන සමාගම/ආයතනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් ආනයනය කරනු ලබන ඖෂධ සංඛ්‍යාව සහ ඒවායේ ඖෂධ නාමයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඉහත (iv)හි සඳහන් සංඛ්‍යාව, මුළු අත්‍යාවශ්‍ය ඖෂධ සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෑතකාලයේ ඇමරිකානු ඩොලරයේ අගය ඉහළ යාමේ ප්‍රතිශතයට වඩා වැඩි ප්‍රතිශතයකින් ඖෂධවල මිල ඉහළ ගිය බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iii) ඖෂධවල මිල ඉහළ යාම පාලනය කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3364/2023

ගරු මයන්ත දිසානායක මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, පොලිස් ස්ථාන පවත්වාගෙන යනු ලබන ගොඩනැගිලි වර්ෂ ගණනාවක් පැරණි බවත්;

(ii) එම පොලිස් ස්ථානවල බැරැක්ක භාවිතා කිරීම ඉතා අපහසු බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගොඩනැගිලි නවීකරණය කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) එම පොලිස් ස්ථාන වෙතින් සේවා ලබා ගැනීමට පැමිණෙන ජනතාවට විධිමත් සේවාවක් ලබා දීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3484/2023

ගරු වේලු කුමාර් මහතා,— ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, පාත හේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පදිංචි පවුල් අතරින් පානීය නල ජල පහසුකම් සහිත පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවතින පානීය ජල ගැටලුව විසඳීම සඳහා ගැනීමට නියමිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 නොවැම්බර් 17 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3515/2023

ගරු අසංක නවරත්න මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති රජයේ රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් එක් එක් රෝහලේ මේ වනවිට සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් රෝහලේ වෛද්‍ය, හෙද හා කනිෂ්ඨ කාර්ය මණ්ඩලයේ තනතුරුවල මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 2020 සිට 2023 දක්වා ඉහත සඳහන් එක් එක් රෝහලේ විදේශීය හා දේශීය නිවාඩු ලබා ගෙන ඇති වෛද්‍යවරුන්, හෙදියන් සහ කනිෂ්ඨ කාර්ය මණ්ඩලයේ සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත කාලය තුළ විශ්‍රාම ගෙන ඇති වෛද්‍යවරුන්, හෙදියන් සහ කනිෂ්ඨ කාර්ය මණ්ඩලයේ සේවකයන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3646/2023

ගරු වඩිවේල් සුරේෂ් මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය, රාජ්‍ය වැවිලි සංස්ථාව හා රාජ්‍ය ව්‍යවසායකත්වය යටතේ පැවති වතුවල කළමනාකරණය, බදු පදනම යටතේ පෞද්ගලික සමාගම් වෙත ලබා දුන් බව දන්නේද;

(ii) එසේ නම්, එම සමාගම් කවරේද;

(iii) එලෙස ලබා දෙන ලද වතු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සමාගම්වල බදු කාලය කොපමණද;

(ii) එම බදු කාලය දීර්ඝ කිරීමට පියවර ගන්නේද;

(iii) එම සමාගම් විසින් ඉහත වතු අතුරු බදු දී තිබෙන බව දන්නේද;

(iv) එසේ නම්, එම සමාගම්/ආයතන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අතුරු බඳු දීමේදී කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි කටයුතු කර තිබේද;

(ii) කම්කරු නීති හා කම්කරු අයිතිවාසිකම් උල්ලංඝනය වන පරිදි නීත්‍යානුකූල නොවන ආකාරයට සිදු කරනු ලබන අතුරු බඳු දීම් වැළැක්වීම සඳහා පියවර ගන්නේ ද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3663/2023

ගරු ලලිත් එල්ලාවල මහතා,— ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සූරියවැව, මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා වැයකර ඇති මුදල කොපමණද;

(ii) එම ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා විදේශ පරිත්‍යාග ලැබුණේද;

(iii) එසේ නම්, එම එක් එක් විදේශ පරිත්‍යාගයේ වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු කර තිබේද;

(ii) නොඑසේ නම්, එම ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා අදාළ ආයතනය තෝරා ගන්නා ලද ක්‍රමවේදය කවරේද;

(iii) ඉදිකිරීම් විදේශ ආයතනයක් විසින් සිදුකරන ලද්දේ නම්, එහි ශ්‍රී ලාංකික නියෝජිතායතනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා වැය කර ඇති රජයේ අරමුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම අරමුදල් ලබා ගන්නා ලද ආයතන කවරේද;

(iii) එම ක්‍රීඩාංගණය විවෘත කරන ලද දිනයේ සිට මේ දක්වා එහි ආදායම සහ වියදම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3673/2023

ගරු හර්ෂණ රාජකරුණා මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ඩෙංගු මර්දන වැඩසටහනෙහි සේවය කරන ලද අනියම්, ආදේශක, කොන්ත්‍රාත් සහ තාවකාලික සේවකයන් 2019 වර්ෂයෙන් පසුව ඉවත් කර තිබේද;

(ii) එසේ ඉවත් කර ඇති සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් සේවකයාගේ නම, ලිපිනය සහ දුරකථන අංකය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඔවුන් ඉවත් කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉවත් කරන ලද එම සේවකයන් නැවත සේවයට කැඳවන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම සේවකයන් සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3707/2023

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2023 ඔක්තෝබර් 01 දින වන විට —

(i) රජයේ පාසල්වල සේවය කරනු ලබන ගුරුවරුන්, ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් සහ අධ්‍යාපන පරිපාලන සේවයේ විදුහල්පතිවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ගණිතය, විද්‍යාව, තාක්ෂණය, ඉංග්‍රීසි, සෞන්දර්ය, ක්‍රීඩා සහ ප්‍රාථමික අධ්‍යාපනය යන එක් එක් විෂය සඳහා සිටිය යුතු ගුරුවරුන් සංඛ්‍යාව සහ මේ වනවිට සේවය කරනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව අධ්‍යාපන කලාපය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) විදුහල්පති තනතුරේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අධ්‍යාපන කලාපය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වැඩබලන විදුහල්පතිවරුන් ලෙස සේවය කරනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව අධ්‍යාපන කලාපය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වැඩිම ගුරු හිඟය හා අතිරික්තය පවතින සහ වැඩිම විදුහල්පති හිඟය හා අතිරික්තය පවතින අධ්‍යාපන කොට්ඨාස විස්සේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2023 නොවැම්බර් 18 සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

9/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ අටවැනි විධායක ජනාධිපතිවරයාට මේ වනවිට සිටින උපදේශකවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) එම එක් එක් උපදේශකවරයා විසින් උපදෙස් දෙනු ලබන විෂය ක්ෂේත්‍රය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් උපදේශකවරයාට ගෙවනු ලබන වැටුප් හා වෙනත් දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඉහත සඳහන් උපදේශකවරුන් පත්කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය හා සලකා බලන ලද නිර්ණායක වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

388/2023

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර ජාතික රෝහලේ මිනිස් අවයව සම්බන්ධ ජාවාරමක් සිදු කරනු ලබන බව 2022.01.27 දින "ලක්සර" සමාජ මාධ්‍ය ප්‍රකාශය මඟින් ප්‍රකාශයට පත් කර ඇති ලිපියකින් චෝදනා එල්ල කර ඇති බවත්;

(ii) ඉහත ජාවාරම සම්බන්ධයෙන් පුළුල් විමර්ශනයක් සිදු කරන මෙන් මහනුවර ජාතික රෝහලේ විශේෂඥ වෛද්‍යවරුන් කණ්ඩායමක් ඉල්ලා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) "මියගිය දායකයන්ගේ අවයව පරිත්‍යාග කිරීමේ ජාතික වැඩසටහනේ" නුවර කලාපයේ ප්‍රධාන මෙහෙයුම් භාර නිලධාරි විසින් මේ සම්බන්ධයෙන් එම රෝහල් අධ්‍යක්ෂවරයාට දැනුම් දී ඇති බවට තොරතුරු තිබේද;

(ii) මෙවැනි චෝදනාවක් එල්ලවීමෙන් මහනුවර ජාතික රෝහල සම්බන්ධයෙන් ජනතාව අතර වැරදි සහගත ආකල්පයක් ඇතිවීම හා රෝහල් පද්ධතිය සම්බන්ධයෙන් විශ්වාසය බිඳී යාම වළක්වා ගැනීම සඳහා පියවර ගන්නේද;

(iii) චෝදනාව පදනම් විරහිත නම්, ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3713/2023

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 ජූලි 01 දින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා මඩකලපුවේ මහාධිකරණ නඩු කටයුතුවලට පත්කරන ලද සහ මාරුවීම් ලබාදෙන ලද විනිශ්චයකාරවරුන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත මාරුවීම්, විනිශ්චයකාරවරුන්ට මාරුවීම් ලබාදෙන සාමාන්‍ය ක්‍රමය අනුව සිදුකර තිබේද;

(iii) නොඑසේ නම්, ඉහත මාරුවීම්වලට හේතු කවරේ ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

3718/2023

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එකතු කළ අගය මත බදු (VAT) ප්‍රතිශතය ඉහළ දමන ලද දිනයේ සිට මේ දක්වා අයකරගෙන ඇති මුළු VAT බදු ආදායම කොපමණද;

(ii) පෙර වර්ෂයේ එම කාලසීමාවට සාපේක්ෂව එම වැඩිවීමේ ප්‍රමාණය කොපමණද;

(iii) එම වැඩිවීම තුළ උද්ධමනය හේතුවෙන් වැඩි වී ඇති ප්‍රතිශතය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නව ආදායම් බදු අනුපාත බලාත්මක කිරීමෙන් පසු අලුතින් විවෘත කර ඇති බදු ලිපිගොනු සංඛ්‍යාව සහ වැසී ගොස් ඇති බදු ලිපිගොනු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) බදු ලිපිගොනු විවෘත කර තිබූ පුද්ගලයන් අතරින් 2023 වර්ෂයේදී විදේශ රටවලට සංක්‍රමණය වී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) උපයන විට ගෙවීමේ බදු තුළින් මේ වනවිට රජයට ලැබෙන මාසික ආදායම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3730/2023

ගරු අකිල එල්ලාවල මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඩෙංගු මදුරු ගහනය ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා ජෛව පාලන ක්‍රමයක් ලෙස බී.ටී.අයි. (B.T.I) බැක්ටීරියාව යොදා ගැනීමේ ශක්‍යතාවය අධ්‍යයනය කිරීම සඳහා විදේශ රටවල් සමඟ සම්බන්ධ වී සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පර්යේෂණ සිදු කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පර්යේෂණ මේ වනවිට නවතා තිබේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iii) ඉහත පර්යේෂණ නවතා දැමීම සඳහා කිසියම් පාර්ශ්වයක් විසින් බලපෑම් සිදු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2023 නොවැම්බර් 20 සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

422/2023

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකාවට පැමිණ නැවත රැකියා සඳහා විදේශගත වූ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසුව රැකියා අහිමි වීම හේතුවෙන් එම ශ්‍රමිකයන් අතරින් යම් පිරිසකට නැවත විදේශගත වීමට නොහැකි වූ බව පිළිගන්නේද;

(iii) විදේශ රැකියා අහිමි වූ එම ශ්‍රමිකයන් සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

(iv) ''සෞභාග්‍යයේ දැක්ම'' ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් පරිදි විදේශ රැකියා නිමකර ශ්‍රී ලංකාවට පැමිණි ශ්‍රමිකයන්ට බදු නිදහස් ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා විශේෂ ව්‍යාපෘති ණය මුදලක් ලබාදීමේ වැඩපිළිවෙළ මේ වනවිට ක්‍රියාත්මක වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

438/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ මෝල්ට් අඩංගු කිරිපිටි වර්ග රැසක් අලෙවි කරනු ලබන බවත්;

(ii) එවායින් සමහරක මනුෂ්‍ය ශරීරයට අහිතකර රසායනික සංයෝග අඩංගු වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මෝල්ට් අඩංගු කිරිපිටි නිෂ්පාදනය කිරීම සඳහා භාවිතා කරනු ලබන අමුද්‍රව්‍ය සම්බන්ධයෙන් අධ්‍යයනයක් කර තිබේද;

(ii) එසේ නම්, එම අමුද්‍රව්‍ය කවරේද;

(iii) එම එක් එක් අමුද්‍රව්‍ය භාවිතා කරනු ලබන අනුපාත හෝ ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෝල්ට් අඩංගු කිරිපිටි පානය කිරීම හේතුවෙන් මනුෂ්‍ය ශරීරයට සිදු වන බලපෑම සම්බන්ධයෙන් පරීක්ෂණ සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම පරීක්ෂණ වාර්තා සභාගත කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

693/2023

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, වවුනතිව් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, කාංචිරන්කුඩා, පාවක්කොඩිචේන, පන්චේන සහ ඉලුප්පඩිචේන යන ගම්මානවලට මේ දක්වා පානීය ජල පහසුකම් ලබා දී නොමැති බවත්;

(ii) ඒ හේතුවෙන් එම ගම්මානවල ජීවත්වන ජනතාව පානීය ජල හිඟයකට මුහුණ දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ගම්මාන සඳහා පානීය ජල පහසුකම් ලබා දීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම ගම්මානවලට පානීය ජල පහසුකම් ලබා දෙනු ලබන කාල වකවානු කවරේද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

820/2023

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පවුල් ඒකකයේ හා සිය දරුවන්ගේ සුරක්ෂිතභාවය සඳහා කාන්තාව සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලබන බව දන්නේද;

(ii) ශ්‍රී ලංකාවේ මුළු කාන්තා ජනගහණය කොපමණද;

(iii) ඒ අතරින් පාසල් යන වයසේ කාන්තා ජනගහණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ මුළු පවුල් ඒකක අතරින් පියා හෝ මව නොමැති පවුල් ඒකක සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල් ඒකකවල සිටින දරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම දරුවන්ට අධ්‍යාපනය ලබාදීමට සහ ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමට වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර තිබේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකාවේ ළමා මව්වරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ළමා මව්වරුන් ඇතිවීමට බලපා ඇති සමාජ හා ආර්ථික සාධක කවරේද;

(iii) මෙම තත්ත්වය වැළැක්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

840/2023

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2022 දක්වා එක් එක් වර්ෂයේ ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද පොල්තෙල් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) පොල්තෙල් ආනයනය කරන ලද රටවල් සහ සමාගම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 නොවැම්බර් 21 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

854/2023

ගරු ගාමිණී වලේබොඩ මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ග කිලෝ මීටර් 100,000ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ සංවර්ධන කටයුතු ආරම්භ කරන ලද මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම මාර්ගවල නම් කවරේද;

(iii) ඉහත ව්‍යාපෘතිය යටතේ මේ වනවිට සංවර්ධන කටයුතු අවසන් කර ඇති මාර්ගවල දිග සහ සංවර්ධන කටයුතු අවසන් කර නොමැති මාර්ගවල දිග වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත ව්‍යාපෘතිය යටතේ මාර්ග සංවර්ධන කටයුතු සිදු කරන ලද කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවන ලද මුදල සහ ගෙවීමට තිබෙන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

875/2023

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇති රජයේ වී ගබඩා මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ගබඩාවේ මේ වනවිට ගබඩා කර ඇති වී ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වනවිට වී අස්වැන්න නෙලීම ආරම්භ කර ඇති බැවින්, එම වී තොග සඳහා ඉහත ගබඩාවල ඉඩ පහසුකම් ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1719/2023

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයේ මේ වනවිට සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2020 සිට මේ දක්වා එම සේවකයන්ට වැටුප් හා දීමනා ගෙවීම සඳහා සහ වෙනත් පහසුකම් ලබා දීම සඳහා වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත කාල සීමාව තුළ මණ්ඩලයට කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයන්ගේ නම් සහ ඔවුන්ට ගෙවන ලද මුදල කොපමණද;

(iii) ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රමාණවත් සේවකයන් පිරිසක් සිටින බැවින් කොන්ත්‍රාත් පදනම මත සේවකයන් බඳවාගැනීම අවම කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2018/2023

ගරු කිංස් නෙල්සන් මහතා,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව,—

(i) වර්ෂ 2015 සිට මේ දක්වා සමෘද්ධි සහනාධාරලාභීන් සංඛ්‍යාව;

(ii) එම කාල සීමාව තුළ දිස්ත්‍රික්කයේ සවිබලගන්වන ලද සමෘද්ධි සහනාධාරලාභීන් සංඛ්‍යාව;

(iii) එසේ සවිබලගැන්වීමෙන් සමෘද්ධි සහනාධාර වැඩසටහනෙන් ඉවත් කරන ලද සමෘද්ධි සහනාධාරලාභීන් සංඛ්‍යාව;

(iv) ඉවත් කරන ලද සමෘද්ධි සහනාධාරලාභීන් වෙනුවට අලුතින් සමෘද්ධි සහනාධාර ලැබීමට සුදුසුකම් ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (iv)හි සඳහන් පුද්ගලයන්ට සමෘද්ධි සහනාධාරය කඩිනමින් ලබාදීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3667/2023

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට ,— (1)

(අ) (i) 2004.12.27 වන දින ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් වික්ටෝරියා නේවාසික කළමනාකරණ කාර්යාලයේදී පවත්වන ලද ඉඩම් කච්චේරිය මඟින් ඉඩම්ලාභීන් ලෙස තෝරා පත් කරනු ලැබූ පුද්ගලයන් 44 දෙනෙකු සඳහා රජවැල්ල සහ රජවැල්ල-උතුර යන ජනාවාසවලින් පර්චස් 10 සහ පර්චස් 15 ප්‍රමාණයේ ඉඩම් කැබලි ලබා දුන් බවත්;

(ii) පර්චස් 10 සහ පර්චස් 15 ප්‍රමාණයේ ඉඩම් කැබලි සඳහා පිළිවෙළින් රුපියල් ලක්ෂ තුන සහ ලක්ෂ හතර බැගින් තක්සේරු වටිනාකමක් ගෙවීමට නියම කරන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අදාළ ඉඩම්ලාභීන්ගෙන් ඉහත සඳහන් තක්සේරු වටිනාකම අයකර ගෙන එම ඉඩම් සඳහා කඩිනමින් ඔප්පු නිකුත් කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 නොවැම්බර් 22 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1334/2023

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2016 සිට 2022 දක්වා එක් එක් වර්ෂයේ පවත්වන ලද අ.පො.ස. (සා. පෙළ)—

(i) විභාගය සඳහා පෙනී සිටි සිසුන් සංඛ්‍යාව;

(ii) විභාගයේ ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා ගත වූ කාලය;

(iii) විභාගයේ ප්‍රතිඵල නැවත සමීක්ෂණය කිරීම සඳහා ගත වූ කාලය;

(iv) විභාගය සමත් වූ සිසුන් සඳහා අ.පො.ස. (උ. පෙළ) පන්ති ආරම්භ කරන ලද දිනය;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1465/2023

ගරු මායාදුන්න චින්තක අමල් මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොල් වගා කිරීමේ මණ්ඩලය සතු පොල් ඉඩම් ප්‍රමාණය එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2019 වර්ෂයේ එම පොල් ඉඩම්වලින් ලබා ගන්නා ලද පොල් ඵලදාව කොපමණද;

(iii) අලුතින් පොල් වගා කිරීම සඳහා හඳුනාගෙන ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එම ඉඩම් පිහිටා ඇති ප්‍රදේශ කවරේද;

(v) පොල් වගා කිරීමේ මණ්ඩලයේ වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2398/2023

ගරු ඉෂාක් රහුමාන් මහතා,— බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ජාතික උරුමයන් ලෙස නම් කර ඇති ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iv) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2695/2023

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දඹුල්ල පූජාභූමි සංවර්ධන වැඩසටහන යටතේ ඉඩම් අහිමි වූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් මේ දක්වා ඉඩම් කොටස් ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව හා ඔවුන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් කොටස් ලබා ගන්නා ලද සමහර පුද්ගලයන් විසින් ඒවා නීති විරෝධි අයුරින් අලෙවි කර ඇති ඇති බව දන්නේද;

(iv) මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2884/2023

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට මත්පැන් නිෂ්පාදනය කරනු ලබන නීත්‍යානුකූල ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනයේ නම සහ ලිපිනය, ආයතනය හිමිකරුගේ නම සහ ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) වර්ෂ 2020 සිට මේ දක්වා ඉහත සඳහන් එක් එක් ආයතනය විසින් ගෙවා ඇති බදු මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ආයතන විසින් ගෙවිය යුතු හිඟ බදු මුදල් තිබේද;

(v) එසේ නම්, එම බදු මුදල් අයකර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 නොවැම්බර් 23 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1513/2023

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික මත්ස්‍ය පරිභෝජනය කොපමණද;

(ii) එම අවශ්‍යතාවයෙන් දේශීයව සපයාගනු ලබන මත්ස්‍ය ප්‍රමාණය හා ආනයනය කරනු ලබන මත්ස්‍ය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකාවට මත්ස්‍යයන් ආනයනය කරනු ලබන රටවල් කවරේද;

(iv) මත්ස්‍ය ආනයනය සඳහා වාර්ෂිකව වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1552/2023

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ස්ථිර නිවාස නොමැති පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) තාවකාලික සෙවිලි භාවිතා කර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිවාස බහුල වශයෙන් පවතින ප්‍රදේශ කවරේද;

(iv) එම නිවාස සඳහා ඉදිරියේදී ස්ථිර සෙවිලි ලබා දීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1588/2023

ගරු සංජීව එදිරිමාන්න මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ සේවකයන් විශ්‍රාම හිමිකම් ලබා ගැනීම සඳහා අදාළ අයදුම්පත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට පෙර ඔවුන් සේවය කර ඇති පෙර සේවා ස්ථානවලදී වැන්දඹු හා අනත්දරු දායක මුදල් අය කර ගෙන ඇති බවට සහතික කළ යුතු බව චක්‍රලේඛයක් මඟින් දන්වා ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් විශ්‍රාමික රජයේ සේවකයන් විශාල පිරිසකට සිය විශ්‍රාම හිමිකම් ලබා ගැනීමට නොහැකි වී ඇති බවත්;

(iii) සමහර රජයේ සේවකයන් සේවය කරන ලද පෙර සේවා ස්ථාන මේ වනවිටත් අහෝසි වී ඇති බැවින් ඉහත චක්‍රලේඛයේ පරිදි පෙර සේවා ස්ථානවලින් ලබා ගත යුතු සහතිකය ලබා ගැනීමට නොහැකි වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) 1980 වර්ෂයෙන් පසු සියලුම කාන්තා සහ පිරිමි රජයේ සේවකයන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක විය යුතු බැවින් එම සේවකයන්ගේ මුල් වැටුපේ සිට දායක මුදල් අය කරනු ලබන හෙයින් ඉහත (අ) (i)හි පරිදි නැවතත් සහතික කිරීම් අවශ්‍ය වන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1622/2023

ගරු තිස්ස අත්තනායක මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2020 වර්ෂයේදී මහේස්ත්‍රාත් අධිකරණ මඟින් දඩ මුදල් වෙනුවෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත එවන ලද රු.7,676,874/- ක් වටිනා චෙක්පත් 154ක් එම අධිකාරිය විසින් නියමිත කාලය තුළදී නිෂ්කාශනය කර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම චෙක්පත් කල් ඉකුත් වී නැවත අධිකරණ වෙත යවා ඇති බව දන්නේද;

(ii) ඉහත සඳහන් චෙක්පත් 154 නියමිත කාල සීමාව තුළ නිෂ්කාශනය කර ගැනීමට එම අධිකාරිය කටයුතු නොකිරීම සඳහා හේතු වූ කරුණු කවරේද;

(iii) මේ සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන් හඳුනාගෙන තිබේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(v) නැවත අධිකරණ වෙත යවා ඇති ඉහත සඳහන් චෙක්පත් 154 වෙනුවට මේ වනවිට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත ලැබී ඇති චෙක්පත් සංඛ්‍යාව සහ එම එක් එක් චෙක්පතේ වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1643/2023

ගරු මිලාන් ජයතිලක මහතා,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සිටින විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්/ආබාධිත පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් වෙනුවෙන් ගෙවනු ලබන මාසික දීමනාව කොපමණද;

(iii) එම දීමනාව ගෙවීම සඳහා වාර්ෂිකව වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ ගොඩනැගිලි නිර්මාණය කිරීමේදී ඉහත පුද්ගලයන්ගේ අවශ්‍යතා සම්බන්ධයෙන් අවධානය යොමු කර තිබේදැයි පසුවිපරම් සිදු කරන්නේද;

(ii) එම අවශ්‍යතා පිළිබඳව අවධානය යොමු නොකර දැනට ඉදිකර ඇති ගොඩනැගිලි සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2023 නොවැම්බර් 24 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1685/2023

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මන්නාරම, වව්නියාව සහ මුලතිව් යන දිස්ත්‍රික්කයන්හි ජීවත්වන ජනතාවට TomEJC වර්ගයේ අඹ පැල හා සූර්ය බල ජල පොම්ප අවශ්‍යතාවයක් ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) ගොවීන්ගේ නිෂ්පාදන ධාරිතාවය ඉහළ නැංවීම සඳහා—

(i) එක් දිස්ත්‍රික්කයකින් ගොවි පවුල් 300 බැගින් මන්නාරම, වව්නියාව හා මුලතිව් යන දිස්ත්‍රික්කවල පදිංචි ගොවි පවුල් 900ක් සඳහා එක් ගොවි පවුලකට අඹ පැල 100 බැගින් අඹ පැල 90, 000ක් ලබා දීමට; සහ

(ii) ඉහත එක් එක් දිස්ත්‍රික්කය සඳහා එකක් රු, 330,000/-ක් වන සූර්ය බල ජල පොම්ප දිස්ත්‍රික්කයට 1500 බැගින් 70%ක සහනාධාරයක් සහ 30% ප්‍රතිලාභි දායකත්වයක් යටතේ ලබා දීමට;

පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1764/2023

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය යටතේ ඇති කාර්මික විද්‍යාල සහ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා ස්ථාපිත කර ඇති ප්‍රදේශ කවරේද;

(iii) ඒවායේ සේවය කරනු ලබන අධ්‍යයන හා අනධ්‍යයන සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කාර්මික විද්‍යාල සහ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා වර්තමානයට ගැලපෙන පරිදි යාවත්කාලීන කර තිබේද;

(iii) වර්ෂ 2015 සිට මේ දක්වා කාර්මික විද්‍යාල සහ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල පාඨමාලා හදාරන ලද අභ්‍යාසලාභීන් අතරින් දේශීය හා විදේශීය රැකියා සඳහා යොමු කර ඇති සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1804/2023

ගරු කුමාරසිරි රත්නායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, පළාත් සභා පාලනය යටතේ පවතින පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති හා සහකාර විදුහල්පති ලෙස සේවය කරනු ලබන ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ශ්‍රේණිධාරී නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත පාසල් අතරින් ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් සිටින පාසල් සංඛ්‍යාව හා වැඩබලන විදුහල්පතිවරුන් සිටින පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදුහල්පති තනතුරේ වැඩබලන උප ගුරුවරුන් ශ්‍රී ලංකා විදුහල්පති සේවයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා තීරණයක් ගෙන තිබූ බව දන්නේද;

(ii) එසේ නම්, එම තීරණය ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

(iii) එම තීරණය ක්‍රියාත්මක නොකරන්නේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1817/2023

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ රිය අනතුරුවලින් මරණයට පත් වූ පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට ශ්‍රී ලංකාවේ රිය අනතුරු සංඛ්‍යාව ඉහළ ගොස් තිබේ නම්, ඒ සඳහා බලපාන ලද හේතු සාධක කවරේද;

(iii) රිය අනතුරු අවම කිරීම සඳහා මේ වනතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2535/2023

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කින්නියා පොලිස් ස්ථානය ස්ථාපනය කරන ලද දිනය කවරේද;

(ii) ඉහත පොලිස් ස්ථානය ස්ථාපනය කර ඇති ඉඩම හිමි පාර්ශ්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කින්නියා පොලිස් ස්ථානය දීර්ඝ කාලයක සිට පුද්ගලික පාර්ශ්වයක් සතු ඉඩමක පවත්වාගෙන යාම හේතුවෙන් එම පොලිස් ස්ථානය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට නොහැකි වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඉහත පොලිස් ස්ථානය සඳහා රජයේ ඉඩමක් සහ ස්ථිර ගොඩනැගිල්ලක් ලබා ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2023 නොවැම්බර් 25 සෙනසුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2579/2023

ගරු ඩී. වීරසිංහ මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ ස්ථාපිත කර ඇති විවිධ සේවා සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමිති විසින් සපයනු ලබන සේවා කවරේද;

(iii) දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීක වැඩිම සංඛ්‍යාවක් ස්ථාපිත කර ඇති ප්‍රදේශය කවරේද;

(iv) පුළුල් මහජන සේවාවක් ලබා දීම සඳහා සමූපකාර ව්‍යාපාරය මෙහෙයවීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2623/2023

ගරු නීතිඥ මධුර විතානගේ මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා කොළඹ වරාය නගර ව්‍යාපෘතියේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපල හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2694/2023

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුර ප්‍රධාන තැපැල් කාර්යාලය ස්ථාපිත කර ඇති ගොඩනැගිල්ල මේ වනවිට අබලන් තත්ත්වයට පත් වී ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් පාරිභෝගික ජනතාවගේ සහ සේවකයන්ගේ ජීවිතවලට පවා තර්ජනයක් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ගොඩනැගිල්ල අලුත්වැඩියා නොකර එය පිහිටි, තැපැල් දෙපාර්තමේන්තුව සතු ඉඩම නිවාස ව්‍යාපෘතියක් සඳහා පෞද්ගලික සමාගමකට ලබා දීමට පියවර ගෙන තිබේද;

(ii) ඒ සඳහා මේ වනවිට එකඟ වී ඇති කොන්දේසි කවරේද;

(iii) ඉඩමේ හා ගොඩනැගිල්ලේ අයිතිය තැපැල් දෙපාර්තමේන්තුව සතුව තබාගෙන එම ඉඩමෙහි ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මේ වනවිට පාඩු ලබන තත්ත්වයක පවතින තැපැල් දෙපාර්තමේන්තුව ලාභ ලබන තත්ත්වයකට පත් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) වර්තමාන සමාජයට හා වෙළඳපොළ අවශ්‍යතාවලට ගැලපෙන පරිදි තැපැල් දෙපාර්තමේන්තුව නවීකරණය කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2849/2023

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මිරිදිය ධීවර කර්මාන්තය සිදු කරනු ලබන ජලාශ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ජලාශ පිහිටා ඇති ප්‍රදේශ කවරේද;

(iii) වාර්ෂිකව නිෂ්පාදනය කරනු ලබන මිරිදිය මත්ස්‍ය අස්වැන්න කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3579/2023

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට තෙල් නලයක් ස්ථාපිත කිරීමට තීරණය කර තිබේද;

(ii) එසේ නම්, එම තීරණය ගැනීම සඳහා බලපාන ලද හේතු සාධක කවරේද;

(iii) එම තෙල් නලය ස්ථාපිත කිරීමේ අරමුණු කවරේද;

(iv) එම තෙල් නලය ස්ථාපිත කිරීමෙන් ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රයට ඇති වන බලපෑම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2023 නොවැම්බර් 27 සඳුදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2974/2023

ගරු හේෂා විතානගේ මහතා,— කාන්තා. ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති ලියාපදිංචි ළමා නිවාස සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් ළමා නිවාසයේ නම, ලියාපදිංචිය ලබා ගෙන ඇති පුද්ගලයා/ ආයතනයේ නම, මේ වනවිට සිටින පිරිමි ළමුන් සංඛ්‍යාව සහ ගැහැණු ළමුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) බොහෝ ළමා නිවාසවල අපචාර ක්‍රියා සිදු වන බව වාර්තා වන බැවින්, ඉහත ළමා නිවාස අධීක්ෂණය කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3079/2023

ගරු අශෝක් අබේසිංහ මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2010 සිට 2022 දක්වා —

(i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මෙහෙයුම් ලාභය/අලාභය;

(ii) මණ්ඩලය විසින් සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තකයින්ගේ භාරකාර අරමුදල වෙත ප්‍රේෂණය කර ඇති දායක මුදල;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3107/2023

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) යාපනය, නෙඩුන්තීවු දූපතේ පිහිටා ඇති සංචාරක ස්ථානවල නම් කවරේද;

(ii) වර්ෂ 2010 සිට 2020 දක්වා නෙඩුන්තීවු දූපතට පැමිණි සංචාරකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සංචාරකයන් ආකර්ශණය කර ගත හැකි ආකාරයෙන් ඉහත සංචාරක ස්ථාන නඩත්තු කරනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i)හි සඳහන් සංචාරක ස්ථාන අතරින් මේ වනවිට ප්‍රතිසංස්කරණය කර ඇති සංචාරක ස්ථානවල නම් කවරේද;

(ii) එම සංචාරක ස්ථාන ප්‍රතිසංස්කරණ කිරීම සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(iii) මේ වනතෙක් එම සංචාරක ස්ථාන ප්‍රතිසංස්කරණය කර නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) නෙඩුන්තිවු දූපතේ පිහිටා ඇති සංචාරක ස්ථාන විධිමත් ලෙස ආරක්ෂා කිරීමට සහ නඩත්තු කිරීමට අමාත්‍යාංශය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3175/2023

ගරු දයාසිරි ජයසේකර මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රසායනික පොහොර භාවිතය තහනම් කර, කාබනික පොහොර හඳුන්වා දෙන ලද වර්ෂයට පෙර වර්ෂ 5ක ශ්‍රී ලංකාවේ වාර්ෂික තේ අස්වැන්න මෙට්‍රික් ටොන්වලින්;

(ii) එම කාල පරිච්ඡේදය තුළ අපනයනය කරන ලද තේ ප්‍රමාණය මෙට්‍රික් ටොන්වලින්;

(iii) එම කාල පරිච්ඡේදය තුළ වාර්ෂික අපනයන ආදායම;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කාබනික පොහොර හඳුන්වා දෙන ලද වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂික තේ අස්වැන්න මෙට්‍රික්ටොන්වලින්;

(ii) එම කාල පරිච්ඡේදය තුළ අපනයනය කරන ලද තේ ප්‍රමාණය මෙට්‍රික්ටොන්වලින්;

(iii) එම කාල පරිච්ඡේදය තුළ වාර්ෂික අපනයන ආදායම;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රසායනික පොහොර භාවිතය තහනම් කිරීමට පෙර සහ පසු ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනයේ වැඩිවීම හෝ අඩුවීම ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) තේ නිෂ්පාදනය දිරිගැන්වීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3589/2023

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සිදු වූ පාස්කු ප්‍රහාරයෙන් පසු තහනම් කරන ලද සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම සංවිධාන තහනම් කිරීමට බලපාන ලද හේතු සාධක කවරේද;

(iv) එම සංවිධාන අතරින් මේ වනවිට තහනම ඉවත් කරන ලද සංවිධාන කවරේද;

(v) තහනම ඉවත් කිරීමට බලපාන ලද හේතු සාධක කවරේද;

(vi) පාස්කු ප්‍රහාරයට සෘජුව හා වක්‍රව සම්බන්ධ සංවිධාන හා පුද්ගලයන්ට එරෙහිව නීතිය දැඩිව ක්‍රියාත්මක කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති සහ ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 නොවැම්බර් 28 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3234/2023

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා මහ බැංකුවේ ''නිකුතු සුරක්ෂිතාගාරයේ'' තැන්පත් කර තිබූ රුපියල් මිලියන 5ක මුදලක් අතුරුදහන් වී තිබේද;

(ii) ඊට වගකිව යුතු නිලධාරීන් අනාවරණය කර ගැනීම සඳහා විමර්ශන සිදු කර තිබේද;

(iii) මේ වනවිට, එම විමර්ශනවල ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ''නිකුතු සුරක්ෂිතාගාරයේ'' ආරක්ෂිත කැමරා සවිකර තිබේද;

(ii) එම ආරක්ෂිත කැමරා පද්ධතියේ පටිගත වී ඇති දර්ශන සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කර තිබේද;

(iii) ශ්‍රී ලංකා මහ බැංකුවේ තැන්පත් කර ඇති මුදල් ආරක්ෂා කර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3335/2023

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2019 නොවැම්බර් මාසයෙන් පසු පත්කර ඇති එක් එක් ජනාධිපති කාර්ය සාධක බලකායේ නම, එය පත්කරන ලද දිනය , සහ මේ වනවිට පවත්වා ඇති රැස්වීම් සංඛ්‍යාව, සාමාජිකයන්ගේ නම්, ඔවුන්ගේ තනතුරු, සුදුසුකම්, ගෙවනු ලබන වැටුප්, දීමනා සහ ලබා දෙන වෙනත් පහසුකම්;

(ii) එම එක් එක් කාර්ය සාධක බලකාය තුළින් ඉටු කර ගැනීමට අපේක්ෂා කරන ලද අරමුණු;

(iii) එම අරමුණු ඉටු කර ගැනීමේ ප්‍රගතිය;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3338/2023

ගරු වාසුදේව නානායක්කාර මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1980 ජූලි වැඩ වර්ජනයට සහභාගී වී රැකියා අහිමිවූවන්ට සහන සැලසීමේ වැඩ සටහන යටතේ 2015.12.31 දින දක්වා එක් වැඩවර්ජකයෙකුට ගෙවූ රු.6000.00ක් වූ මාසික දීමනාව වෙනුවට 2016 වර්ෂයේ අයවැය යෝජනා පරිදි එක් වරක් පමණක් ගෙවා අවසන් කරනු ලබන රු.250,000.00ක මුදලක් ලබා දීමට තීරණය කරන ලද බවත්;

(ii) ඒ අනුව, 2022 වර්ෂයේ දෙසැම්බර් මාසය දක්වා වයස අවුරුදු 65 සම්පූර්ණ වූ වැඩවර්ජකයන්ට ඉහත මුදල නිසි පරිදි ගෙවා ඇති බවත්;

(iii) 2023 වර්ෂයේ ජනවාරි මාසයේ සිට මේ දක්වා වයස අවුරුදු 65 සම්පූර්ණ වූ කිසිදු වර්ජකයෙකුට එම මුදල ගෙවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත අ(iii)හි සඳහන් වැඩවර්ජකයන්ට එම මුදල නැවත ගෙවීම ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(ii) ඔවුන්ට ඉහත මුදල නොගෙවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3355/2023

ගරු ජයන්ත සමරවීර මහතා,— බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුරාවිද්‍යා ප්‍රදේශයක් ලෙස ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මේ වනවිට හඳුනාගෙන ඇති පුරාවිද්‍යා ප්‍රදේශ සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් පුරාවිද්‍යා ප්‍රදේශයේ නම, පිහිටා ඇති පළාත, දිස්ත්‍රික්කය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මේ වන විට ගැසට් මඟින් ප්‍රකාශයට පත් කර ඇති පුරාවිද්‍යා ප්‍රදේශ සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් පුරාවිද්‍යා ප්‍රදේශයේ නම, එය පිහිටා ඇති පළාත, දිස්ත්‍රික්කය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පුරාවිද්‍යා ප්‍රදේශයක් ලෙස මේ වනතෙක් ගැසට් මඟින් ප්‍රකාශයට පත් නොකරන ලද පුරාවිද්‍යා ප්‍රදේශ ගැසට් කිරීම සඳහා කාල රාමුවක් සකස් කර තිබේද;

(ii) එසේ නම්, එම කාල රාමුව කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3366/2023

ගරු මයන්ත දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාස්කු දින සිදු කරන ලද ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් මරණයට පත් වූ පුද්ගලයන් වෙනුවෙන් ඔවුන්ගේ පවුල්වලට වන්දි ලබා දී තිබේද;

(ii) එම ප්‍රහාරය හේතුවෙන් දෙමව්පියන් අහිමි වූ දරුවන් රැකබලාගැනීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(iii) එම දරුවන් රැකබලා ගැනීම සඳහා ඔවුන්ගේ ඥාතීන් වෙත මාසික දීමනාවක් ගෙවනු ලබන්නේද;

(iv) එම ප්‍රහාරය හේතුවෙන් ආපදාවට ලක් වී සිටින පුද්ගලයන් සඳහා රජයේ අනුග්‍රහයෙන් විදේශ ප්‍රතිකාර ලබා දීමට කටයුතු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 නොවැම්බර් 29 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3483/2023

ගරු වේලු කුමාර් මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වතු ඉඩම්, කිරි ගොවිපොළ පිහිටුවීම සඳහා ලබා දීමට 2021.09.06 දින අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඒ සඳහා ''ගලබොඩ'' සහ ''මවුන්ට් ජීන්'' යන එක් එක් වත්තෙන් ලබා ගනු ලබන ඉඩම් අක්කර ප්‍රමාණය;

(ii) එම ඉඩම් ලබා ගනු ලබන එක් එක් සමාගම, එම එක් එක් සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ නම් සහ ජාතිකත්වය (ස්වදේශීකද / විදේශිකද);

(iii) ඉහත එක් එක් සමාගම විසින් ගෙවනු ලබන අත්තිකාරම් මුදල සහ ඉඩම් අක්කරයක වාර්ෂික බදු මුදල;

(iv) ඉහත වතුවල කිරි ගොවිපොළ සඳහා වෙන් කරනු ලබන භූමියේ ඇති පේලි නිවාස හා සිද්ධස්ථාන සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත වතු පිහිටා ඇති දිස්ත්‍රික්කවල ඇති රජයේ කිරි ගොවිපොළ සතුව ප්‍රමාණවත් ඉඩම් තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, තේ වගා කළ හැකි ඉඩම්, කිරි ගොවිපොළ සඳහා ලබාදීමේ පදනම කවරේද;

(iii) මෙම කිරි ගොවිපොළ පිහිටුවීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3648/2023

ගරු වඩිවේල් සුරේෂ් මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හින්දු ජනතාවගේ ආගමික කටයුතු සඳහා බදුල්ල දිස්ත්‍රික්කයේ වතු සහ නගර ආශ්‍රිතව හින්දු කෝවිල් ඉදිකර ඇති බවත්;

(ii) වතු කම්කරුවන්ගේ මාසික වැටුපෙන් අයකර ගනු ලබන සාමාජික මුදල්වලින් හා මහජන නියෝජිතයන් විසින් ලබා දෙන ප්‍රතිපාදනවලින් වතු ආශ්‍රිත කෝවිල් ඉදිකර ඇති බවත්;

(iii) මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් වතු ආශ්‍රිතව ඉදිකර ඇති කෝවිල් බොහොමයක් අර්ධ වශයෙන් ඉදිකර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ ඉදිකර ඇති කෝවිල් සංඛ්‍යාව කොපමණද;

(ii) වතු ආශ්‍රිතව ඉදිකර ඇති කෝවිල් සංවර්ධනය කිරීම සඳහා පියවර ගන්නේද;

(iii) එසේනම්, එම කෝවිල් සංවර්ධනය/සංරක්ෂණය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3664/2023

ගරු ලලිත් එල්ලාවල මහතා,— වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මත්තල, රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ ඉදිකිරීම සඳහා වැය වී ඇති මුදල කොපමණද;

(ii) එම ගුවන් තොටුපළ ඉදිකිරීම් සඳහා විදේශ පරිත්‍යාග ලැබුණේද;

(iii) එසේ නම්, එම එක් එක් විදේශ පරිත්‍යාගයේ වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ගුවන් තොටුපළ ඉදිකිරීම් සඳහා වැය කරන ලද රජයේ අරමුදල් ප්‍රමාණය කොපමණද;

(v) එම අරමුදල් ලබා ගන්නා ලද ආයතන කවරේද;

(vi) එම ගුවන් තොටුපළේ මෙහෙයුම් ආරම්භ කරන ලද දිනයේ සිට මේ දක්වා එහි ආදායම සහ වියදම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ගුවන් තොටුපළ ඉදිකිරීම් සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු කර තිබේද;

(ii) නොඑසේ නම්, ගුවන් තොටුපළ ඉදිකිරීම සඳහා අදාළ ආයතනය තෝරා ගන්නා ලද ක්‍රමවේදය කවරේද;

(iii) ඉදිකිරීම් කටයුතු විදේශ ආයතනයක් විසින් සිදු කරන ලද්දේ නම්, එහි ශ්‍රී ලාංකික නියෝජිතායතනය කවුරුන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3708/2023

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව;

(ii) ඒවා අතරින් දේශපාලනඥයන්ට සහ රාජ්‍ය නිලධාරීන්ට එරෙහිව ඇති පැමිණිලි සංඛ්‍යාව;

(iii) ඉහත (i)හි සඳහන් පැමිණිලි අතරින් අධිකරණට යොමු කළ සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව;

(iv) මූලික විමර්ශනයෙන් පසුව හෝ අධිකරණ විභාගය අතරතුරදී කොමිෂන් සභාව විසින් ඉල්ලා අස්කර ගත් පැමිණිලි/නඩු සංඛ්‍යාව;

(v) එම එක් එක් පැමිණිල්ලට/නඩුවට අදාළ විත්තිකරුවන්ගේ නම්;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා අධිකරණයට යොමු කළ පැමිණිලි අතරින් අධිකරණ විසින් දණ්ඩනයක් නියම කරන ලද සහ අධිකරණය විසින් ප්‍රතික්ෂේප කරන ලද පැමිණිලි/නඩු සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව;

(ii) ප්‍රතික්ෂේප කළ එක් එක් පැමිණිල්ලට/නඩුවට අදාළ විත්තිකරුවන්ගේ නම්;

(iii) වැරදිකරුවන් කරන ලද පුද්ගලයන්ගෙන් අයකර ගත් දඩ මුදල එක් එක් වර්ෂය අනුව;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3719/2023

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ සාක්ෂරතා අනුපාතය;

(ii) වාර්ෂිකව පාසල් හැර යන සිසුන් සංඛ්‍යාව එක් එක් ශ්‍රේණිය අනුව වෙන් වෙන් වශයෙන්;

(iii) පාසල් හැර යන සිසුන් සඳහා ඇති වෘත්තීය පුහුණු පාඨමාලා සංඛ්‍යාව;

(iv) වර්ෂ 2020 සිට 2022 දක්වා එම වෘත්තීය පුහුණු පාඨමාලා යටතේ පුහුණුව ලබා ඇති සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ ඇති කාර්මික විද්‍යාල සංඛ්‍යාව;

(ii) ඒ අතරින් ක්‍රියාත්මකව පවතින කාර්මික විද්‍යාල සංඛ්‍යාව;

(iii) මේ වනවිට කාර්මික විද්‍යාලවල ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2023 නොවැම්බර් 30 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

11/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019.04.21 දින සිදු කරන ලද පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලිසිය විසින් අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා ක්‍රියා කළ පොලිස් නිලධාරින් ඇගයීමට අමාත්‍යාංශය විසින් ගනු ලැබූ පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

390/2023

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1841 අංක 4 දරන අයාල ආඥා පනතේ 3(අ) වගන්තිය සහ 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 40 වගන්තිය අනුව සිඟමන් යැදීම නීති විරෝධී බවත්;

(ii) ශ්‍රී ලංකාවේ අනෙකුත් නගරවල මෙන්ම මහනුවර නගරයේ පොදු ස්ථානවල සහ පදික වේදිකාවල සිඟමන් යදින යාචකයන් දැකිය හැකි අතර ඒ අතර කුඩා දරුවන් අත දරා සිටින කාන්තාවන්ද සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත කාන්තාවන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී තිබේද සහ එම කාන්තාවන් සමඟ සිටින දරුවන්ගේ අධික නිද්‍රාශීලී බවට හේතුව එම දරුවන්ටද මත්ද්‍රව්‍ය ලබා දී තිබීමද යන්න සම්බන්ධයෙන් පරීක්ෂණ සිදු කර තිබේද;

(ii) මෙම දරුවන්ට පාසල් අධ්‍යාපනය ලබාදීමේ හැකියාවක් පවතීද;

(iii) පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් මෙම දරුවන් සම්බන්ධයෙන් පසුවිපරම් කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර තිබේද;

(iv) යාචකයන් සඳහා නිවාස සංකීර්ණයක් ඉදිකිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

424/2023

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික ආහාරමය පොල්තෙල් පරිභෝජනය;

(ii) එම ප්‍රමාණයෙන් දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන ප්‍රමාණය;

(iii) ආනයනය කරනු ලබන පොල්තෙල් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දේශීය පොල්තෙල් නිෂ්පාදකයන් අතරින් මේ වනවිට ලියාපදිංචි නිෂ්පාදකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ලියාපදිංචි නොවූ පොල්තෙල් නිෂ්පාදකයන් සිටින බව දන්නේද;

(iii) ඔවුන් විසින් නිෂ්පාදනය කරනු ලබන පොල්තෙල් වෙළඳපොළට නිකුත් කරනු ලබන බව පිළිගන්නේද;

(iv) ප්‍රමිතියට අනුකූල නොවන පොල්තෙල් නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදකයන්ට එරෙහිව ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

437/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගොන්ගල, හේස්වත්ත ආසන්නයේ ගිං ගඟේ ජල පෝෂක ප්‍රදේශය යන්ත්‍ර සූත්‍ර යොදා එළිපෙහෙළි කරන බවත්;

(ii) ගොන්ගල මුදුනට විශාල මාර්ගයක් සකස් කර ඇති බවත්;

(iii) මේ හේතුවෙන් ඉදිරියේදී නායයෑම් ඇති විය හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පරිසර විනාශය වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ගොන්ගල පරිසර පද්ධතියේ ඉඩම් හෙක්ටයාර් දෙදහස් පන්සියයක් සිංහරාජ වනාන්තරයට එක් කිරීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද ගැසට් පත්‍රය ක්‍රියාත්මක නොවීමට හේතු කවරේද;

(ii) ගොන්ගල පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

692/2023

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ ස්ථාපිත කර ඇති ලංකා විදුලිබල මණ්ඩලයේ කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කාර්යාලය ස්ථාපිත කර ඇති ස්ථානය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් කාර්යාලයේ සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත කාර්යාල අතරින් කුලී පදනම මත ලබා ගෙන ඇති ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන කාර්යාල කවරේද;

(v) එම කාර්යාල සඳහා ස්ථිර ගොඩනැගිලි ඉදිකිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2023 දෙසැම්බර් 01 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

821/2023

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ස්ථාපිත කර ඇති රාජ්‍ය විශ්වවිද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) විශ්වවිද්‍යාල පනත යටතට නොගැනෙන විශ්වවිද්‍යාල හෝ විශ්වවිද්‍යාල ආයතන කවරේද;

(iv) ඒවා පිහිටුවා ඇති පනත් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2022 වර්ෂය වනවිට රාජ්‍ය විශ්වවිද්‍යාලවල හා අනෙකුත් විශ්වවිද්‍යාලවල ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව හා ඒවායේ කථිකාචාර්යවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල විසින් පවත්වනු ලබන උපාධි පාඨමාලාවල කාලය එක් එක් උපාධි පාඨමාලාව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) විශ්වවිද්‍යාල සඳහා බඳවා ගනු ලබන උපාධි අපේක්ෂකයන් සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සාමාන්‍ය උපාධිධාරියකු බිහි කිරීම සඳහා රජය විසින් දරනු ලබන වියදම කොපමණද;

(ii) වෛද්‍යවරයකු, ඉංජිනේරුවරයකු සහ කථිකාචාර්යවරයකු බිහි කිරීම සඳහා රජය විසින් දරනු ලබන වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

841/2023

ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා,— ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට 2022 දක්වා මහනුවර, පල්ලෙකැලේ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයේ පවත්වා ඇති ජාත්‍යන්තර ක්‍රිකට් තරග සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් තරගයෙන් උපයාගෙන ඇති ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 2010 සිට 2022 දක්වා එම ක්‍රීඩාංගණය නඩත්තු කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ක්‍රීඩාංගණයේ නඩත්තු කටයුතු ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

855/2023

ගරු ගාමිණී වලේබොඩ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව, මනම්පිටිය පාලම ප්‍රදේශයේ වැලි හැරීම සඳහා නව මංකඩ 26කට අවසර ලබා දීමට කටයුතු කරමින් පවතින බව දන්නේද;

(ii) එසේ නම්, එම අවසර ලබාදීමට පෙර පරිසර වාර්තාවක් ලබා ගෙන තිබේද;

(iii) එසේ නම්, එම වාර්තාව සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i)හි සඳහන් අවසර ලබා දීම, මනම්පිටිය පාලම අවට ප්‍රදේශයේ පදිංචි වී සිටින ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවලට අහිතකර ලෙස බලපාන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

876/2023

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023 වර්ෂයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ වගා කර ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එමගින් අපේක්ෂිත වී අස්වැන්න කොපමණද;

(iii) එම වී අස්වැන්න මිලදී ගැනීම සඳහා වී අලෙවි මණ්ඩලය සතු සැලසුම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3685/2023

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට ,— (1)

(අ) (i) ඉන්දියානු රජයේ ණය ආධාර යටතේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීමට යෝජිත සූර්යබල විදුලි ව්‍යාපෘතිය මගින් උත්පාදනය කිරීමට අපේක්ෂිත මෙගා වොට් 135ක විදුලිය, ජාතික විදුලිබල පද්ධතියට එක් කිරීමේදී ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති/වැඩසටහන් කවරේද;

(ii) රජයේ ආයතන, රජයේ පාසල් සහ ආගමික සිද්ධස්ථාන එම ව්‍යාපෘති/ වැඩසටහන් සඳහා ඇතුළත් වන්නේද;

(iii) එසේ නම්, සූර්ය පැනල සවිකිරීම සඳහා කොළඹ, ගම්පහ, කළුතර, මහනුවර, මාතලේ සහ නුවරඑළිය යන එක් එක් දිස්ත්‍රික්කයෙන් තෝරා ගෙන ඇති ආගමික සිද්ධස්ථානයේ නම, ලිපිනය සහ ග්‍රාම නිලධාරි වසම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඒ අතරින් මේ වනවිට අදාළ ඇස්තමේන්තු අනුමත කර ඇති එක් එක් ආගමික සිද්ධස්ථානයේ නම, ලිපිනය සහ ග්‍රාම නිලධාරි වසම වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම ව්‍යාපෘති/වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 දෙසැම්බර් 02 සෙනසුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1335/2023

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ ඇති බෞද්ධ විහාරස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම විහාරස්ථාන අතරින් විශාල වශයෙන් අඩුපාඩු සහිත විහාරස්ථාන හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, ඒවා කවරේද;

(iv) එම විහාරස්ථාන සංවර්ධනය කිරීම සඳහා පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් විහාරස්ථාන අතරින් පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත විහාරස්ථාන හඳුනාගෙන තිබේද;

(ii) එම විහාරස්ථාන සංරක්ෂණය කිරීම සඳහා මේ වනවිට ක්‍රියාත්මක කරනු ලබන වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1721/2023

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ හේරත්ගම නමින් වනජීවී කලාපයක් තිබෙන බවත්;

(ii) එම වනජීවී කලාපය අවට ඇති ගම්මානවලට වනඅලි තර්ජන පවතින බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) එසේ නම්, එම ගැටලුව සඳහා විසඳුම් ලබාදීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2021/2023

ගරු කිංස් නෙල්සන් මහතා,— ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සේවය කරනු ලබන භෞත චිකිත්සකවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් භෞත චිකිත්සකවරයාගේ නම හා ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් හෞත චිකිත්සකවරුන්ගේ රාජකාරි ස්වභාවය කවරේද;

(iv) ඔවුන්ට ගෙවනු ලබන වැටුප් හා වෙනත් දීමනා කවරේද;

(v) ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ වර්තමාන පසුබෑම මගහරවා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2696/2023

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ ඇති රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම පාසල් අතරින් අ.පො.ස. (උසස් පෙළ) සඳහා තාක්ෂණික විෂය ධාරාව උගන්වනු ලබන පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ නම් කවරේද;

(v) තාක්ෂණික විෂය ධාරාව මාතලේ දිස්ත්‍රික්කයේ පාසල් සිසුන් අතර තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2885/2023

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකාව සහ තායිලන්තය අතර වෙළඳ ශේෂයේ වෙනස එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ශ්‍රී ලංකාව සහ තායිලන්තය අතර නිදහස් වෙළඳ ගිවිසුමක් අත්සන් කිරීමෙන් ශ්‍රී ලංකාවට හිමිවන වාසි සහ අවාසි වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 දෙසැම්බර් 04 සඳුදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1466/2023

ගරු මායාදුන්න චින්තක අමල් මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2019 සිට මේ දක්වා පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් බෙදා දී ඇති පොල් පැළ සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය සහ වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පොල් පැළ බෙදා දීම වෙනුවෙන් මණ්ඩලයට වැය වූ මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පොල් පැළ බෙදා දීමේදී සලකා බලන ලද නිර්ණායක කවරේද;

(iv) පැළ බෙදා දීමේ වැඩසටහනේ ප්‍රගතිය සම්බන්ධයෙන් පසුවිපරම් කරනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1514/2023

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයෙන් පසු දේශපාලන පළිගැනීම්වලට ලක් වී ඇති ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පළිගැනීම් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණ සිදු කර තිබේද;

(iii) පළිගැනීම්වලට ලක් වූ සේවකයන් අතරින් මේ වනවිට සහන ලබා දී ඇති සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) සහන ලබා දීමට ඉතිරිව ඇති සේවකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1553/2023

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා ඉදිරියේදී ඇතුළත් කර ගැනීමට සැලසුම් කර ඇති සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) පාඨමාලාව අවසන් කරන ලද විද්‍යාපීඨ සිසුන්ට පත්වීම් ලබා දෙනු ලබන දිනය කවරේද;

(iii) අධ්‍යාපන විද්‍යාපීඨ පාඨමාලා, උපාධි පාඨමාලා බවට පත් කරනු ලබන දිනය කවරේද;

(iv) අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා ඉදිරියේදී ඇතුළත් කර ගනු ලබන සිසුන්ට උපාධි ප්‍රදානය කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1596/2023

ගරු සංජීව එදිරිමාන්න මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඒකාබද්ධ සේවයේ කළමනාකරණ සේවා නිලධාරි තනතුරේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) 2021 වර්ෂයේ පවත්වන ලද කළමනාකරණ සේවා නිලධාරි තනතුරට බඳවාගැනීමේ සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මේ වනවිට නිකුත් කර ඇති බව දන්නේද;

(iii) ඉහත විභාගයේ ප්‍රතිඵල මත බඳවාගැනීමට නියමිත කළමනාකරණ සේවා නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන් බඳවාගනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2400/2023

ගරු ඉෂාක් රහුමාන් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඉස්සන් වගාව සිදු කරනු ලබන ප්‍රදේශ කවරේද;

(ii) ශ්‍රී ලංකාවේ වාර්ෂික ඉස්සන් නිෂ්පාදනය කොපමණද;

(iii) ඉස්සන් වගා කර්මාන්තය සඳහා ලබා දී ඇති සහන කවරේද;

(iv) ඉස්සන් වගාකරුවන් දිරිගැන්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අපනයනය කිරීම සඳහා ඉස්සන් වගාව සිදු කරනු ලබන ව්‍යවසායකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2016 සිට මේ දක්වා ඉස්සන් අපනයනය කිරීමෙන් උපයා ගන්නා ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉස්සන් අපනයනය කිරීමෙන් උපයා ගනු ලබන ආදායම ඉහළ නංවා ගැනීම සඳහා කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 දෙසැම්බර් 05 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1624/2023

ගරු තිස්ස අත්තනායක මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පවතින එළවළු බීජ අලෙවි මධ්‍යස්ථාන මඟින් අලෙවි කරනු ලබන එළවළු බීජ පිළිබඳ තොරතුරු කඩිනමින් ලබා ගැනීම සඳහා පරිගණකගත තොරතුරු පද්ධතියක් ස්ථාපිත කර නොමැති බව දන්නේද;

(ii) එළවළු බීජ නිෂ්පාදනය හා සැපයීම පිළිබඳව දත්ත කඩිනමින් සැපයීම සඳහා පරිගණකගත තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම අත්‍යාවශ්‍ය බව පිළිගන්නේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) ඉහත සඳහන් පරිගණකගත තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීමට පියවර ගන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

(vi) එවැනි පරිගණකගත තොරතුරු පද්ධතියක් ස්ථාපිත නොකරන්නේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1644/2023

ගරු මිලාන් ජයතිලක මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට වාලච්චේන කඩදාසි කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කටයුතු සිදු කරන්නේද;

(ii) එහි නිෂ්පාදනය කරනු ලබන කඩදාසි වර්ග කවරේද;

(iii) එම ප්‍රමාණය දේශීය කඩදාසි අවශ්‍යතාවයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iv) එම කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1686/2023

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වවුනියාව දිස්ත්‍රික්කයේ, වෙංගල චෙට්ටිකුලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගොවීන්ගේ වගාවලට වනඅලින් හා වඳුරන් වැනි සතුන් විසින් අඛණ්ඩව හානි සිදු කරනු ලබන බවත්,

(ii) වනජීවී දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධයෙන් ස්ථිර පියවරක් නොගැනීම හේතුවෙන් එම ගොවීන් කෘෂිකාර්මික කටයුතුවලින් ඉවත්වීමේ තත්ත්වයක් උද්ගත වී ඇති බවත්,

(iii) මේ සම්බන්ධයෙන් අමාත්‍යවරයා වෙත 2020.10.20 දිනැතිව මා විසින් කරන ලද ලිඛිත ඉල්ලීමට මේ වනතෙක් කිසිදු පියවරක් ගෙන නොමැති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) වෙංගල චෙට්ටිකුලම ප්‍රදේශයේ ගම්මාන 17 ක් ආවරණය වන පරිදි අලි වැටක් ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉල්ලා සිටින ලද රු.මිලියන 368.2 ක මුදල ලබා නොදීමට හේතු කවරේද;

(ii) ඉහත වගාබිම් වනඅලින් හා වඳුරන් වැනි සතුන්ගෙන් ආරක්ෂා කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1765/2023

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය යටතේ පවතින අභිජනන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා ස්ථාපිතකර ඇති ප්‍රදේශ කවරේද;

(iii) නව අභිජනන මධ්‍යස්ථාන ඉදිකිරීමට සැලසුම් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා ජලාශවලට මුදාහැර ඇති මත්ස්‍ය පැටවුන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉදිරියේදී ජලාශවලට මුදාහැරීමට සැලසුම් කර ඇති මත්ස්‍ය පැටවුන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3238/2023

ගරු කුමාරසිරි රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාත් සභාවේ කර්මාන්ත අමාත්‍යාංශය යටතේ මොනරාගල දිස්ත්‍රික්කයේ පවත්වාගෙන යනු ලබන වඩු පුහුණු පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් අතරින් මේ වනවිට ක්‍රියාකාරී තත්ත්වයේ පවතින වඩු පුහුණු පාසල් කවරේද;

(iii) එම පුහුණු පාසල්වල සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2018 සිට 2022 දක්වා ඉහත (අ)(i)හි සඳහන් වඩු පුහුණු පාසල්වලින් පුහුණුව ලබා ඇති පුහුණුලාභීන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පුහුණුලාභීන් අතරින් මේ වනවිට රැකියාගත කර ඇති පුහුණුලාභීන් සංඛ්‍යාව කොපමණද;

(iii) රැකියාගත කිරීමට අමතරව එම පුහුණුලාභීන් සඳහා ලබා දෙන වෙනත් පහසුකම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2023 දෙසැම්බර් 06 බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1819/2023

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද දුම්රිය මැදිරි සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) එම දුම්රිය මැදිරි ගෙන්වනු ලැබූ රටවල් කවරේද;

(iv) එම දුම්රිය මැදිරි ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද සමාගම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත මැදිරි අතරින් මේ වනවිට ධාවනයට යොදවා ඇති දුම්රිය මැදිරි සංඛ්‍යාව කොපමණද;

(ii) ධාවනයට යොදා නොගෙන මේ වනවිට ගාල් කර ඇති දුම්රිය මැදිරි සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවා ධාවනයට යොදා නොගැනීමට හේතු කවරේද;

(iv) එම දුම්රිය මැදිරි කඩිනමින් ධාවනයට යොදා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2537/2023

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ප්‍රධාන දුම්රිය ස්ථානය සහ අනෙකුත් දුම්රිය ස්ථානවල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම එක් එක් දුම්රිය ස්ථානය සඳහා අනුමත සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් දුම්රිය ස්ථානයේ මේ වනවිට සේවය කරනු ලබන සුළු සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත සඳහන් දුම්රිය ස්ථානවල මේ වනවිට පවතින සුළු සේවක පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2581/2023

ගරු ඩී. වීරසිංහ මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2019 සිට මේ දක්වා මහපොළ භාරකාර අරමුදල විසින් විශ්වවිද්‍යාල සිසුන් සඳහා ලබා දී ඇති මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව සංඛ්‍යාව කොපමණද;

(ii) නියමිත කාලය තුළදී උපාධිය සම්පූර්ණ නොකරන විශ්වවිද්‍යාල සිසුන් සඳහා ශිෂ්‍යාධාර ගෙවීමට අතිරේක මුදලක් වැය කිරීමට සිදු වන්නේද;

(iii) එසේ නම්, පසුගිය වර්ෂ 10ක කාල පරිච්ඡේදය තුළදී වැය කරන ලද අතිරේක මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට මහපොළ භාරකාර අරමුදලේ පවතින ශේෂය කොපමණද;

(ii) අදාළ ආයතන විසින් මහපොළ භාරකාර අරමුදල වෙත අඛණ්ඩව ප්‍රතිපාදන ලබා දෙන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2625/2023

ගරු නීතිඥ මධුර විතානගේ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණු හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපල හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනුලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3155/2023

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකා පොලීසියේ, පොලිස් පරීක්ෂක, පොලිස් සැරයන් සහ පොලිස් කොස්තාපල් යන එක් එක් තනතුරේ සේවය කරනු ලබන නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් එක් එක් තනතුරේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත තනතුරුවල සේවය කරනු ලබන නිලධාරීන්ට උසස්වීම් ලබාදීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iv) පොලිස් සැරයන් තනතුරේ සිට පොලිස් පරීක්ෂක තනතුරට උසස් වීම සඳහා ගත වන කාලය කොපමණද;

(v) ශ්‍රී ලංකා පොලීසියට ආධුනික පොලිස් කොස්තාපල්වරුන් බඳවාගැනීමේදී, මේ වනවිට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2023 දෙසැම්බර් 07 බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2850/2023

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා ස්ථාපිත කර ඇති ප්‍රදේශ කවරේද;

(iii) වර්ෂ 2019 සිට මේ දක්වා නිවාඩු නිකේතනවලින් උපයා ඇති ආදායම කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශය යටතේ පවතින නිවාඩු නිකේතනවල විදේශීය සංචාරකයන් සඳහා නවාතැන් පහසුකම් සැපයීමට ක්‍රමවේදයක් සකස් කර තිබේද;

(ii) වර්ෂ 2019 සිට මේ දක්වා ඉහත නිවාඩු නිකේතන භාවිතා කර ඇති සංචාරකයන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2975/2023

ගරු හේෂා විතානගේ මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති පුරාවිද්‍යාත්මක ස්ථාන සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වර්ෂ 2015 සිට මේ දක්වා එම ස්ථාන සංවර්ධනය කිරීම සඳහා වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3080/2023

ගරු අශෝක් අබේසිංහ මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2010 සිට 2015 දක්වා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින්—

(i) නිකුත් කරන ලද මාසික සහ වාර්ෂික වාර ප්‍රවේශ පත්‍ර සඳහා;

(ii) ත්‍රිවිධ හමුදා හා පොලිස් නිලධාරින්ට නිකුත් කරන ලද වාර ප්‍රවේශ පත්‍ර සඳහා;

(iii) ක්‍රියාත්මක කරන ලද "නිසි සැරිය", "ගැමි සැරිය" හා "සිසු සැරිය" ප්‍රවාහන සේවා සඳහා;

මහා භාණ්ඩාගාරය විසින් ලබා දෙන ලද සහනාධාර මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම සහනාධාර මුදල් මහා භාණ්ඩාගාරය විසින් මේ වනවිටත් ලබා දෙන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3097/2023

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා පත් කරන ලද ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා සම්බන්ධයෙන් කර ඇති නිරීක්ෂණ හා නිර්දේශ කවරේද;

(ii) ඔහු පොලිස් පරිපාලන අංශ ප්‍රධානි තනතුරට පත් කරන ලද දිනය, එම තනතුර සඳහා ඔහු නිර්දේශ කරන ලද දිනය සහ එම තනතුරට ඔහු නිර්දේශ කරන ලද පුද්ගලයන්ගේ හා ආයතනවල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් චෝදනා එල්ල වී ඇති ඉහත නිලධාරියා එම තනතුරට පත් කිරීම සඳහා බලපෑ සාධක කවරේද;

(iv) ඉහත පත් කිරීම, නැවත සලකා බැලීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3580/2023

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සිදු වූ පාස්කු ප්‍රහාරය සිදුවීමට ආසන්න දිනකදී, එවැනි ප්‍රහාරයක් එල්ල විය හැකි බවට බුද්ධි අංශ වෙත තොරතුරු ලැබුණු දිනය කවරේද;

(ii) එම බුද්ධි තොරතුරු යොමු කරන ලද රජයේ ආයතන හා නිලධාරීන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම තොරතුරු ලබා දීමෙන් පසු, අදාළ අංශ විසින් ඒ සම්බන්ධයෙන් නිසි අවධානය යොමු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iv) බුද්ධි අංශ මඟින් ලබා දෙන ලද තොරතුරු වෙත නිසි අවධානය යොමු නොකිරීම සම්බන්ධයෙන්, පාස්කු ප්‍රහාරය පිළිබඳ සොයා බැලීමට පත්කළ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ දැක්වෙන තොරතුරු හා අදාළ නිලධාරීන්ගේ නම් කවරේද;

(v) එම බුද්ධි තොරතුරු සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග නොගත් පුද්ගලයන්ට එරෙහිව මේ වනවිට ගෙන ඇති හා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 දෙසැම්බර් 08 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3110/2023

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය, නෙඩුන්තිවු දූපතේ ඇති මාර්ගවල මුළු දිග කොපමණද;

(ii) එම දූපතේ පදිංචි වී සිටින ජනතාවගේ ප්‍රවාහන පහසුකම් සපුරාලීමට ප්‍රමාණවත් විධිමත් බස්රථ සේවාවන් ක්‍රියාත්මක වන්නේද;

(iii) එම දූපතේ මේ වනවිට ධාවනය කරනු ලබන බස්රථ සංඛ්‍යාව කොපමණද;

(iv) එම බස්රථ ධාවනය කරනු ලබන මාර්ගවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත දූපතේ පදිංචි ජනතාවගෙන් සැලකිය යුතු පිරිසකට ප්‍රවාහන පහසුකම් නොමැති බව දන්නේද;

(ii) එම ජනතාවගේ ප්‍රවාහන පහසුකම් සම්බන්ධයෙන් අවධානය යොමු නොකිරීමට හේතු කවරේද;

(iii) මෙම ජනතාව මුහුණ දෙනු ලබන ප්‍රවාහන අපහසුතා සඳහා විසඳුම් ලබා දෙනු ලබන දින වකවානු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3176/2023

ගරු දයාසිරි ජයසේකර මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රසායනික පොහොර භාවිතය තහනම් කර, කාබනික පොහොර හඳුන්වා දෙන ලද වර්ෂයට පෙර වර්ෂ 5ක ශ්‍රී ලංකාවේ වාර්ෂික වී අස්වැන්න මෙට්‍රික් ටොන්වලින්;

(ii) එම කාල පරිච්ඡේදය තුළ රසායනික පොහොර ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල;

(iii) ඉහත කාල පරිච්ඡේදය තුළ වී වගා කරන ලද බිම් ප්‍රමාණය;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කාබනික පොහොර හඳුන්වා දෙන ලද වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂික වී අස්වැන්න;

(ii) එම කාල පරිච්ඡේදය තුළ කාබනික පොහොර ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල;

(iii) රසායනික පොහොර භාවිතය තහනම් කිරීමට පෙර සහ පසු වී නිෂ්පාදනයේ වැඩිවීම හෝ අඩුවීම ප්‍රතිශතයක් ලෙස;

(iv) රසායනික පොහොර භාවිතය තහනම් කිරීමට පෙර සහ පසු වී නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ලද බිම් ප්‍රමාණයේ වැඩිවීම හෝ අඩුවීම ප්‍රතිශතයක් ලෙස;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) වී නිෂ්පාදනය දිරිගැන්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3235/2023

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ගුවන් යානා ඉන්ධන ගබඩාවක් ස්ථාපිත කිරීම සඳහා පෞද්ගලික අංශයට අවසර ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම පෞද්ගලික ව්‍යවසායකයාගේ නම කවරේද;

(iii) එම ව්‍යවසායකයා තෝරාගන්නා ලද ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගුවන් යානා ඉන්ධන ගබඩා ස්ථාපිත කිරීම සඳහා පෞද්ගලික අංශය විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉදිරියේදී එම ඉල්ලීම් සඳහා අවසර ලබා දෙනු ලබන ක්‍රමවේද කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3411/2023

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ස්ථාපිත කර ඇති එක් එක් රජයේ විශ්වවිද්‍යාලයේ ඇති පීඨයන්හි නම්, එම එක් එක් පීඨය පිහිටුවා ඇති ප්‍රදේශය, පවත්වනු ලබන උපාධි පාඨමාලා, එම උපාධි පාඨමාලා පවත්වනු ලබන භාෂා මාධ්‍යය, බඳවාගනු ලබන සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත සඳහන් උපාධි පාඨමාලා අදාළ භාෂා මාධ්‍යයෙන් පැවැත්වීම සඳහා අවශ්‍ය ආචාර්යවරුන් හා මහාචාර්යවරුන් ප්‍රමාණවත් පරිදි සිටින්නේද;

(iii) නොඑසේ නම්, ආචාර්ය සහ මහාචාර්ය තනතුරුවල පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3501/2023

ගරු වාසුදේව නානායක්කාර මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාස්කු ප්‍රහාරය, කොරෝනා වසංගතය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් ව්‍යාපාර අඩපණ වූ, මීගමුවේ සංචාරක කර්මාන්තය ආශ්‍රිත සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන්ට, ණය ආපසු ගෙවීම සඳහා වර්ෂ 3 1/2ක සහන කාලයක් ලබා දුන් බවත්;

(ii) නමුත්, 2019 වර්ෂයේදී සහන කාලය ලබාදෙන ලද අවස්ථාව වනවිට තිබූ ණය ශේෂය මෙන් දෙගුණයකටත් වඩා වැඩි ණය ශේෂයක් ඉහත ව්‍යවසායකයන්ගේ ගිණුම්වලට මේ වනවිට බැර කර ඇති බවත්;

(iii) එම ණය ශේෂය ගෙවීම පැහැර හැරියහොත් ඇපයට තබා ඇති දේපළ පරාටේ නීතිය අනුව අත්පත් කර ගන්නා බවට දැනුම් දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ණය සහන කාලය ලබා දීමට හේතු වූ කරුණු සැලකිල්ලට නොගෙන මූල්‍ය ආයතනවල අවශ්‍යතාවය පරිදි කටයුතු කිරීමට අවසර දී තිබේද;

(ii) ණය සහන ලබා දෙන අවස්ථාව වනවිට පැවති ණය ශේෂය පමණක් ගෙවා, සහන කාලය සඳහා වන පොලිය කපාහැරිය යුතු බව පිළිගන්නේද;

(iii) එසේ නම්, එම පොලිය කපාහැරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2023 දෙසැම්බර් 09 සෙනසුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3357/2023

ගරු ජයන්ත සමරවීර මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ආයෝජන ව්‍යාපෘතිවලට ලබා දී ඇති ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ඉඩම් ප්‍රමාණය එක් එක් මහවැලි කලාපය, දිස්ත්‍රික්කය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් හෙක්ටයාර් කොපමණද;

(ii) එම එක් එක් ඉඩම ලබා දී ඇති ආයෝජකයාගේ නම, ලිපිනය, ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය සහ මේ වනවිට ඉඩම භාවිතා කරනු ලබන කාර්යය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත ඉඩම් අතරින් ලබා දුන් කාර්යය සඳහා භාවිතා කරනු නොලබන ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එම ඉඩම් ලබාගෙන ඇති ආයෝජකයන් කවුරුන්ද;

(v) ඔවුන්ට එරෙහිව ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ඉඩම් බෙහැර කිරීමේ බලය ඇති නිලධාරියා කවුරුන්ද;

(ii) මේ වන විට බෙහැර කර ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3367/2023

ගරු මයන්ත දිසානායක මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ කුරුඳු වගා කරනු ලබන ප්‍රදේශ කවරේද;

(ii) රජය සහ පෞද්ගලික අංශය සතු කුරුඳු ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) කුරුඳු නිෂ්පාදනයෙන් උපයනු ලබන වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව කුරුඳු අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, එම රටවල් කවරේද;

(iii) වාර්ෂිකව අපනයනය කරනු ලබන කුරුඳු ප්‍රමාණය කොපමණද;

(iv) කුරුඳු අපනයනය කිරීමෙන් උපයනු ලබන වාර්ෂික අපනයන ආදායම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3485/2023

ගරු වේලු කුමාර් මහතා,— ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වතුකරයේ වැවිලි කලාපවල සංවර්ධන ව්‍යාපෘති සිදු කිරීම වෙනුවෙන් "වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන අධිකාරිය" ස්ථාපිත කර ඇති බව දන්නේද;

(ii) එම අධිකාරියේ පරිපාලන ව්‍යුහය කවරේද;

(iii) එම අධිකාරිය සඳහා මේ වනවිට පත් කර ඇති නිලධාරීන්ගේ නම් කවරේද,

(iv) එම පත්වීම් සිදුකිරීමේදී සලකා බලන ලද සුදුසුකම් එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කවරේද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අධිකාරියේ අරමුණු කවරේද;

(ii) එම අධිකාරිය විසින් ඉටු කරනු ලබන කාර්යයන් කවරේද;

(iii) එම අධිකාරියේ ඉදිරි වැඩකටයුතු සම්බන්ධයෙන් සැලසුම් සකස් කර තිබේද;

(iv) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3665/2023

ගරු ලලිත් එල්ලාවල මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාගම් රුහුණුපුර ජාත්‍යන්තර සම්මන්ත්‍රණ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(ii) එම සම්මන්ත්‍රණ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා විදේශ පරිත්‍යාග ලැබුණේද;

(iii) එසේ නම්, එම එක් එක් විදේශ පරිත්‍යාගයේ වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සම්මන්ත්‍රණ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු කර තිබේද;

(ii) නොඑසේ නම්, අදාළ ඉදිකිරීම් ආයතනය තෝරා ගන්නා ලද ක්‍රමවේදය කවරේද;

(iii) ඉදිකිරීම් විදේශ ආයතනයක් විසින් සිදු කරන ලද්දේ නම්, එහි ශ්‍රී ලාංකික නියෝජිතායතනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සම්මන්ත්‍රණ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා වැය කර ඇති රජයේ අරමුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම අරමුදල් ලබා ගන්නා ලද ආයතන කවරේද;

(iii) එම සම්මන්ත්‍රණ මධ්‍යස්ථානය විවෘත කරන ලද දිනයේ සිට මේ දක්වා එහි ආදායම සහ වියදම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3681/2023

ගරු වඩිවේල් සුරේෂ් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උඩරට දුම්රිය මාර්ගය, සංචාරකයන්ගේ ආකර්ෂණයට ලක් වූ විශේෂ දුම්රිය මාර්ගයක් බවත්;

(ii) සතියේ දිනවල කොළඹ සිට බදුල්ල දක්වා මගී දුම්රිය හතරක්, බදුල්ල සිට කොළඹ දක්වා මගී දුම්රිය හතරක් සහ සති අන්තයේ දිනවල අමතර සංචාරක දුම්රියක් එම දුම්රිය මාර්ගයේ ධාවනය කරවනු ලබන බවත්;

(iii) වතුකරය ආශ්‍රිතව හා ඒ අවට ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ගමන් පහසුව එම දුම්රියවලින් සලසා ගන්නා බැවින් එම දුම්රියවල අධික තදබදයක් පවතින බවත්;

(iv) එම තදබදය හේතුවෙන් මහනුවර, ඇල්ල, දෙමෝදර, බණ්ඩාරවෙල සහ නුවරඑළිය සංචාරක කලාප කරා ගමන් කරන දේශීය විදේශීය සංචාරකයන් මෙන්ම අනෙක් මගීන් දැඩි අපහසුතාවයකට පත්වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මගී තදබදය වැළැක්වීම සඳහා එම මාර්ගයේ දුම්රිය ගමන් වාර සංඛ්‍යාව වැඩි කිරීමට හෝ මේ වනවිට ක්‍රියාත්මක ගමන් වාර සඳහා භාවිතා කරනු ලබන මැදිරි සංඛ්‍යාව වැඩි කිරීමට පියවර ගන්නේද;

(ii) බදුල්ල-කොළඹ රාත්‍රී තැපැල් දුම්රියේ පහසුකම් වැඩි කිරීමට කඩිනම් පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 දෙසැම්බර් 11 සඳුදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

10/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමට භාජනය වූ පුද්ගලයන් සංඛ්‍යාව හා අත්අඩංගුවට ගත් පුද්ගලයන් සංඛ්‍යාව සම්බන්ධයෙන් වූ දත්තවල අඩුපාඩු පවතින බව දන්නේද;

(ii) එම ප්‍රහාරය සම්බන්ධයෙන් නඩු පවරා ඇති පුද්ගලයන් සංඛ්‍යාව, එම එක් එක් පුද්ගලයාගේ නම හා සේවා ස්ථානය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මේ වනවිට එම පුද්ගලයන්ට ඔවුන්ගේ සේවා ආයතන විසින් අඩ වැටුප් හා වෙනත් දීමනා ගෙවන බව දන්නේද;

(iv) පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

391/2023

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර ජාතික රෝහලට අයත් ඉඩම් අනවසර පදිංචිකරුවන් විසින් අත්පත් කර ගෙන ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් එම රෝහලට අයිති ඉඩම්වලින් අඩකට වඩා අහිමි වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ අත්පත් කර ගෙන ඇති ඉඩම් අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම්වල අනවසරයෙන් පදිංචි වී සිටින පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පවුල් සම්බන්ධයෙන් මේ වනවිට නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iv) අනවසර පදිංචිකරුවන් වෙනත් ප්‍රදේශයක පදිංචි කිරීම සඳහා මේ වනවිට සැලසුම් කර තිබේද;

(v) එසේ නම්, එම සැලැස්ම කවරේද;

(vi) අදාළ ආයතන සහ බලධාරීන් විසින් ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

425/2023

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොල් මද ආශ්‍රිත නිෂ්පාදනවලින් ශ්‍රී ලංකාව විසින් වාර්ෂිකව උපයනු ලබන විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

(ii) පොල් මද ආශ්‍රිත නිෂ්පාදන සිදු කරනු ලබන ලියාපදිංචි කර්මාන්තකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) නීත්‍යානුකූල නොවන අයුරින් පොල් මද සකස් කර නීත්‍යානුකූල ආයතන වෙත සපයනු ලබන කර්මාන්තකරුවන් සිටින බව පිළිගන්නේද;

(iv) ගුණාත්මක භාවයෙන් අඩු පොල් මද ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කිරීම හේතුවෙන් ජාත්‍යන්තර වෙළඳපොළේ ශ්‍රී ලංකාවේ පොල් ආශ්‍රිත නිෂ්පාදන සන්නාමයට හානියක් සිදු වන බව පිළිගන්නේද;

(v) ගුණාත්මක භාවයෙන් අඩු පොල් මද ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කිරීම වැළැක්වීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3711/2023

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2021 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ සිදු වූ —

(i) රිය අනතුරු සංඛ්‍යාව;

(ii) මාරක රිය අනතුරු සංඛ්‍යාව;

(iii) රිය අනතුරුවලින් මරණයට පත් වූ, පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වූ, බරපතළ තුවාල ලැබූ සහ සාමාන්‍ය තුවාල ලබා රෝහල් ගතවූ පුද්ගලයන් සංඛ්‍යාව;

(iv) රිය අනතුරුවලට ලක් වූ වාහන සංඛ්‍යාව;

(v) රිය අනතුරුවලට ලක් වූ වාහන අතරින් නැවත භාවිතයට ගත නොහැකි ලෙස විනාශ වූ වාහන සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රිය අනතුරු හේතුවෙන් රජයට වාර්ෂිකව වැය කිරීමට සිදු වී ඇති අතිරේක වැය බර ගණනය කර තිබේද;

(ii) එසේ නම්, එම වාර්ෂික අතිරේක වැය බර, සෞඛ්‍ය, මහාමාර්ග සහ ප්‍රවාහන යන එක් එක් ක්ෂේත්‍රය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3720/2023

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට ,— (1)

(අ) (i) වර්ෂ 2019 සිට 2022 දක්වා අ.පො.ස. (උසස් පෙළ) විභාගයට අයදුම් කරන ලද අයදුම්කරුවන් සංඛ්‍යාව සහ එම විභාගයට පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අයදුම්කරුවන් අතරින් විශාල පිරිසක් අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී නොසිටින බව පිළිගන්නේද;

(iii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබන වර්ෂය කවරේද;

(ii) නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සහ අ.පො.ස. (උසස් පෙළ) විභාග සම්බන්ධයෙන් සිදු කිරීමට අපේක්ෂිත ප්‍රධාන ප්‍රතිසංස්කරණ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල පවතින ගුරු හිඟය කොපමණද;

(ii) එම ගුරු හිඟය මගහැරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2023 දෙසැම්බර් 12 අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

439/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආනයනික මත්වතුර ඇසුරුම්වල අලවන ආරක්ෂිත ස්ටිකරය මුද්‍රණය කිරීම සඳහා වන ටෙන්ඩරය සඳහා ඉදිරිපත්වූ සමාගම්/ආයතන කවරේද;

(ii) එම එක් එක් සමාගම/ආයතනය ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත ටෙන්ඩරය ලද මැඩ්‍රාස් සෙකියුරිටි ප්‍රින්ටර්ස් ආයතනය ඉදිරිපත් කළ ටෙන්ඩර් පිටපත ඉදිරිපත් කරන්නේද;

(iv) එම ආයතනයට ටෙන්ඩරය ප්‍රදානය කිරීම අනුමත කළ පුද්ගලයන් කවුරුන්ද;

(v) අනෙකුත් ආයතනවලට සාපේක්ෂව ඉහත ආයතනයට තිබූ සුදුසුකම් කවරේද;

(vi) එම ආයතනය තෝරා ගැනීමට අදාළ වාර්තාව ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ටෙන්ඩරය සඳහා ඉදිරිපත් වන අවස්ථාවේදී ඉහත ආයතනයට ISO 9001/14298/27001 සහතිකය හා IHMA සාමාජිකත්වය ලද බවට ලිපි තිබුණේද;

(ii) එසේ නම්, ඒවායේ පිටපත් ඉදිරිපත් කරන්නේද;

(iii) ඉහත ටෙන්ඩරය සඳහා ඉදිරිපත් වූ ආයතන, ජාත්‍යන්තර අසාදු ලේඛනගත ආයතන නොවන බවට තහවුරු කර ගැනීමට ක්‍රමවේදයක් තිබුනේද;

(iv) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

(v) ඉහත ආයතනයේ දේශීය නියෝජිතයා කවුරුන්ද;

(vi) ස්ටිකර් සැපයීම සහ ආරක්ෂක ඩිජිටල් කේතයන් සැපයීම උදෙසා ඉහත ආයතනය අත්සන් කළ ත්‍රෛපාර්ශ්වික ගිවිසුමේ පිටපතක් ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

694/2023

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව, මඩ/පට්/කුරුක්කල්මඩම් කලෙයිවාණි මහා විද්‍යාලය මේ වනවිට මහ වීදියේ ස්ථාපිතකර ඇති අතර එම විද්‍යාලය පෙර තිබූ ස්ථානයේ පැවති ක්‍රීඩාපිටියෙන් කොටසක් මේ වනවිට ශ්‍රී ලංකා යුද හමුදාව භාරයේ පවතින බවත්;

(ii) ඒ හේතුවෙන් ක්‍රීඩා කිරීම සඳහා එම ක්‍රීඩාපිටිය භාවිතා කිරීමට නොහැකි වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත ක්‍රීඩාපිටිය ශ්‍රී ලංකා යුද හමුදාවෙන් නිදහස් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) නැගෙනහිර පළාතේ තවත් ක්‍රීඩාපිටි යුද හමුදාව භාරයේ පවතින්නේද;

(ii) එසේ නම්, එම ක්‍රීඩාපිටි සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවා පිහිටි ස්ථාන කවරේද;

(iv) එම ක්‍රීඩාපිටිද ශ්‍රී ලංකා යුද හමුදාවෙන් නිදහස් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

823/2023

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව පළමුවරට දේශීය හා විදේශීය වශයෙන් ණය ලබා ගන්නා ලද වර්ෂය සහ ණය මුදල කවරේද;

(ii) මේ වනවිට ලබා ගෙන ඇති ණය ප්‍රමාණය දේශීය හා විදේශීය මූලාශ්‍රය අනුව ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් හා ශ්‍රී ලංකා රුපියල්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ණය ලබා දෙන ලද ආයතන/ රටවල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවට ඉන්ධන, ගෑස්, කිරිපිටි, ආහාර හා ඖෂධ ආනයනය කිරීම සඳහා වාර්ෂිකව වැය කිරීමට සිදු වන මුදල ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වර්ෂ 2019 සිට 2022 දක්වා අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීම සඳහා වැය කර ඇති මුදල එක් එක් වර්ෂය අනුව ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

842/2023

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ ස්ථාපිත කර ඇති ක්‍රීඩා පාසල්වල නම් කවරේද;

(ii) එම එක් එක් ක්‍රීඩා පාසලේ මේ වනවිට ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සිසුන්ට ලබා දෙන දීමනා හා වෙනත් පහසුකම් කවරේද;

(iv) ක්‍රීඩා පාසල් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

856/2023

ගරු ගාමිණී වලේබොඩ මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොලිස් නිලධාරින්ගේ භාෂා භාවිතයේ පවතින සීමාවන් හේතුවෙන් ඔවුන්ගෙන් සේවය ලබා ගැනීමේදී සමහර ජනවර්ගවලට අයත් පුද්ගලයන්ට අසාධාරණයක් සිදු වන බව දන්නේද;

(ii) මේ වන විට ශ්‍රී ලංකා පොලීසියේ සේවය කරනු ලබන දෙමළ භාෂාවෙන් රාජකාරි කළ හැකි පොලිස් නිලධාරින් සංඛ්‍යාව කොපමණද ;

(iii) එම නිලධාරින් සංඛ්‍යාව ප්‍රමාණවත්ද;

(iv) නොඑසේ නම්, දෙමළ භාෂාවෙන් රාජකාරි කළ හැකි පොලිස් නිලධාරින් සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 දෙසැම්බර් 13 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

877/2023

ගරු රෝහණ බංඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට විවෘත හා සීමිත තරඟ විභාග යටතේ බඳවාගන්නා ලද නිලධාරින් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව;

(ii) එම එක් එක් නිලධාරියාගේ නම, ලිපිනය සහ වර්තමාන සේවා ස්ථානය;

(iii) ඉහත නිලධාරින් අතරින් වර්ෂ 2018 සිට මේ දක්වා ස්ථාන මාරුවීම් සඳහා අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරින් සංඛ්‍යාව, එම එක් එක් නිලධාරියාගේ නම, ලිපිනය සහ සේවා ස්ථානය;

(iv) ඉහත (iii)හි සඳහන් නිලධාරින් අතරින් මේ දක්වා ස්ථාන මාරුවීම් ලබා ඇති සහ ස්ථාන මාරුවීම් ලබා නොමැති නිලධාරින් සංඛ්‍යාව, එම එක් එක් නිලධාරියාගේ නම සහ සේවා ස්ථානය;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකා විදුහල්පති සේවය, ශ්‍රී ලංකා ගුරු සේවය වැනි සේවාවල මෙන් සාධාරණ ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය සඳහා ක්‍රියාත්මක කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1336/2023

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ ඇති බෞද්ධ විහාරස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම දිස්ත්‍රික්කයේ දුෂ්කර ගම්මානවල පිහිටා ඇති, විශාල වශයෙන් අඩුපාඩු සහිත බෞද්ධ විහාරස්ථාන හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, ඒවා කවරේද;

(iv) එම විහාරස්ථාන සංවර්ධනය කිරීම සඳහා පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් විහාරස්ථාන අතරින් පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත විහාරස්ථාන හඳුනාගෙන තිබේද;

(ii) එම විහාරස්ථාන සංරක්ෂණය කිරීම සඳහා මේ වනවිට ක්‍රියාත්මක කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1722/2023

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2022 වර්ෂයේ ශ්‍රී ලංකාවේ පැවැත්වීමට නියමිතව තිබූ 15 වැනි ආසියානු කුසලාන ක්‍රිකට් තරඟාවලිය වෙනත් රටක පැවැත්වූ බවත්;

(ii) ඒ හේතුවෙන් ක්‍රිකට් ක්‍රීඩාව තුළින් ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය සඳහා විශාල දායකත්වයක් ලබා ගැනීමට තිබූ අවස්ථාව අහිමි වූ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත තරඟාවලිය ශ්‍රී ලංකාවේ නොපවත්වා වෙනත් රටක පැවැත්වීමට බලපාන ලද හේතු කවරේද;

(ii) මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2022/2023

ගරු කිංස් නෙල්සන් මහතා,— ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඉදිකර ඇති ජාත්‍යන්තර ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩාංගණ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටි ස්ථාන කවරේද;

(iii) පොළොන්නරුව දිස්ත්‍රික්කය සඳහා ජාත්‍යන්තර ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩාංගණයක් ඉදිකිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2886/2023

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නකොළගනේ ග්‍රාම නිලධාරි වසම ඇතුළු ග්‍රාම නිලධාරි වසම්වල පිහිටා ඇති ඉඩම් ප්‍රමාණයක්, නකොළගනේ රජමහා විහාරස්ථානයට අයත් නින්දගම් ලෙස සඳහන් කරමින්, ව්‍යාපාරිකයන්ට බදු දීමේ සැලසුමක් ක්‍රියාත්මක වන බවට පරිසරවේදීන් විසින් පෙන්වා දී තිබෙන බවත්;

(ii) ශ්‍රී ලංකාවේ වනඅලි ගහනයෙන් 20%ක් පමණ ඉහත සඳහන් ප්‍රදේශයේ ජීවත් වන බවත්;

(iii) එම ඉඩම් බදු දීම හේතුවෙන් ඉහත ප්‍රදේශයේ පවතින අලි - මිනිස් ගැටුම තවදුරටත් උග්‍ර විය හැකි බවත්;

එතුමිය පිළිගන්නෙහිද?

(ආ) ඉහත බදු දීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?